
# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක්    www.budusarana.lk    email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ක් වූ නිකිණි අමාවක පෝ ද, 2021 සැප්තැම්බර් 06 සඳුද  BUDUSARANA MONDAY SEPTEMBER 06, 2021

56 කාණ්ඩය, 11 පත්‍රය, ආරම්භය 1965 - 06 - 13 , ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.    පිටු 12



බරණැස් සිටුතුමා තෙරුවන් සරණ යෑම

# අත්තම්මා ගේ කරුණාව



ඕස්ට්‍රේලියාවේ, පර්ත් නුවර
**අජාන් බ්‍රහ්මවංසෝ හිමි**

දවසේ ඕනෑ ම වෙලාවක, දවාලක, රැයක මට බැදපු අලපෙති කන්න ඕනෑ වුණා ම මම මගේ අත්තම්මා ගේ ගෙදරට යනවා.

" පුතාට බැදපු අල පෙති කන්න ඕන ද?"

ඇය අසනවා. මම "ඔව්" කියා කිව්වා ම ඇය කුස්සියට ගිහින් අල පෙති ගසා මා වෙනුවෙන් අල පෙති ටිකක් බදිනවා.

"එයා අද රෑ කෑම කන්න ඕනෑ"

කියා මගේ අම්මා , අත්තම්මාට දෙස් කිව්වත් ඇය ඒ කිසි දෙයක් ගණන් ගන්නේ නෑ.

"මට ඔය කතාවලින් වැඩක් නෑ. එයාට ඕන බැදපු අල පෙති නම්, මම ඒවා එයාට දෙනවා."

කියා අත්තම්මා කියනවා.

සමහර වෙලාවට ඒ වගේ ආච්චිලා, සීයලා ඔබටත් ඉන්න ඇති. ඔබ ඔවුන්ට හරිම කැමතියි. ආදරෙයි. ඔවුන් හැම දෙයකට ම ඇඟිලි ගහන්නේ නෑ. දෝෂාරෝපණය කරන්නේ නෑ. ළමයින් හදන්න, පුහුණු කරන්න යන්නේ නෑ. වියපත් වැඩිහිටියන් හා ඔවුන්ගේ මුණුපුරු මිණිපිරියන් බොහෝ සතුටෙන් එකට එක්කාසු වෙන්නේ මේ හින්දා තමයි.

ගුරුවරයකු ව ඉන්න කාලේ පුංචි ළමයකුගෙන් මම මෙහෙම ඇහුවා.

"අම්මා, නැති නම් තාත්තා සමග පමණක් ජීවත් වෙන්න කැමැති ද?"

මම මේ ප්‍රශ්නය ඇසුවා ම වයස අවුරුදු දහයක විතර දැරිය මෙහෙම කිව්වා.



"එක අම්මා කෙනෙක් ඉන්න පවුලක දරුවෙක් වෙලා ඉන්න මම නම් කැමැති නෑ."

"ඒ ඇයි " කියා මම ඇසුවා.

"අම්මා මාත් එක්ක තරහ වෙච්ච වෙලාවට මා ව හුරතල් කරන්න, මා ව සනසන්න තාත්තා කෙනෙක් ඉන්න ඕන."

ඇය උත්තර දුන්නා.

එය හරිම හුරතල් කතාවක්. සමහර වෙලාවට තාත්තා නැති, අම්මා විතරක් ඉන්න පවුලක අම්මා එක්ක නොහොඳක් ඇති වුණොත් දරුවන් සනසන්න තාත්තා කෙනෙක් නෑ. ඔබේ ගෙදර අම්මා, තාත්තා, ආච්චි, සීයා, නැන්දලා, මාමලා වගේ නෑදෑයෝ පිරිලා ඉන්නවා කියා සිතන්න. එතකොට ඔබේ දරුවන් සනසන්න , හැම වෙලාවට ම කවුරු හරි ඉන්නවා. ඔබ ඔබේ දරුවන්ගෙන් අහන්න. ආච්චිලා, සීයලා ගෙදර ඉන්න එකේ වැදගත්කම. ඔබේ දරුවෝ ඔබට කියාවි.

පරිවර්තනය
**සමරසිංහ ගුණසේකර**



# ආලෝකය දකිමින් අඳුරේ ගිලීම

පනස් පස් වසරක් ම ඌරන් මැරීමත්, පවුලේ සාමාජික පිරිස සමග එම මස් අනුභව කිරීමත්, ඉතිරි කොටස් විකිණීමත් සිදු කරමින් ඉතා පව්ටු දිවි පෙවෙතක් ගත කළ චුන්ද සූකරික ඌරු වැද්දා වාසය කළේ රජගහ නුවර වේළුවනාරාමය සමීපයේ ය. ඌරන් ඇති දැඩි කරන ලොකු කුඩා කොටු ද ඔහු ගේ නිවෙසෙහි ම ඉදිකොට තිබිණි.

චුන්ද සූකරික ඌරන් මැරීම සිදු කරනුයේ මෙසේ ය. ඌරන් කා බී ඇති දැඩි වූ පසු පැන යන්නට නොහැකි පරිදි කණුවක තද කොට මාංශ තර කරන්නට මුගුරකින් තලයි. එවිට ඌරා මර හඬ දෙයි. එලෙස පැය කිහිපයක් තලා කට හරවා දඬු කඩක් දමා කකියන උණුදිය ඌරා ගේ කටට වත් කරයි. එවිට ඒ උණුදිය කුස තුළට ගොස් සියලු මළ මුත්‍ර තික්ම කුස පිරිසුදු වෙයි. අනතුරුව එම උණුදිය ම ඇඟට ද වත් කොට ඌරා ගේ ලොම් හා කළු හම ගලවා දමයි.

එ සමයෙහි බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ සිටියහ. තුනුරුවන් පිදීමට උදේ සවස බොහෝ සැදැහැවත්හු වේළුවනාරාමයට එති. ඌරු වැද්දා නිතර එය දකියි. එහෙත් ඒ කිසිත් ගැන මදකදු සැලකිල්ලක් නොදක්වයි. වේළුවනාරාමයෙන් නැඟෙන පූජා හඬ පවා ඔහු ගේ කණට අමිහිරි ය. ආසන්නයේ ම ජීවත් වුවත් එකම දිනයෙකදු ඔහු බුදුරජාණන් වහන්සේ නොදුටුවේ ය. සිදු කළ කිසිදු පින්කමක් ද නැත.

කලක් ගත වුණි. ඌරු වැද්දාට බලවත් රෝගයක් හට ගැනුණි. සිරුරට ඉවසිය නොහැකි වේදනාවක් ගෙන දුන්නේ ය. මිය යෑමට කල් තිබියදී ත් අවීචි මහා නරකයෙහි වැටී ගිය කලෙක මෙන් මහා ගිනි කඳෙකින් දැවී ගියාක් මෙන් වේදනාවට පත් විය. තමන් කළ කර්මයට අනුරූප ව ඌරු හඬ නිකුත් කරමින් දෙදණින් නිවෙසෙහි එහා මෙහා යන්නට විය. එවිට නිවෙසෙහි වසන්නෝ ඔහු තද කොට අල්ලා කට වසති. එහෙත් කර්ම විපාකය වූ කලී කිසිවෙකුටත් වැළැක්විය නොහැකි ය. එහෙයින් චුන්ද සූකරිකගේ ඌරු හඬ නැගීම නවතාලන්නට ඔවුහු අසමත් වූ හ. දිවා රෑ දෙකෙහි ම හේ ඌරු හඬ දුන්නේ ය. දෙදණින් නිවෙසේ එහා මෙහා යන්නේ ය. එහෙයින් අවට නිවැසියෝ ද නිදි නොලැබ පීඩාකාරී ලෙස රැය පහන් කළහ. චුන්ද සූකරික ගේ ඥාතීන්ට ද දෙස් නගන්නට වූ හ. ඥාතීහු දෙස් ඇසීමෙන් ගැලවිය නොහැකි තැන ඔහු අල්ලා ගෙය තුළට ම ලා සිර කොට තැබී ය. ඒ ඔහු ගේ මර හඬ පිටතට නො ඇසෙන සේ දොර ජනෙල් වසා තබමිනි. චුන්ද සූකරික මෙසේ සත් දිනක් ම නිවස තුළ ම මර හඬ දෙමින් දැඩි දුක් විඳ සත්වැනි දා මිය ගොස් අවීචි මහා නරකයෙහි උපන්නේ ය.

දිනක් ඔහුගේ නිවෙස අසලින් විටින් විට වැඩම වූ භික්ෂූන් වහන්සේ පිරිසක්, ඒ මර හඬ අසා ඌරකු මොරගෑමකැයි සිතූහ. බුදුරජාණන් වහන්සේ වෙත එළඹ

"ස්වාමීනි, චුන්ද සූකරික නම් ඌරු වැද්දා වසන නිවෙසේ දොර ජනෙල් ද වසා දින ගණනාවක් ම ඌරන් මරණ බව පෙනේ. ඔහු ගේ නිවෙසේ මඟුලක් විය යුතු ය. මෙ පමණ ඌරන් මරන්නා වූ ඔහුට කිසිත් සත්ව කරුණාවක්, මෛත්‍රියක් නූපදින බව නම් මහා පුදුමයකි. මෙ තරම් දරුණු මිනිසකු අපි කවරදා හෝ දැක නැත්තෙමු" යි කී හ. එයට පිළිතුරු දුන් බුදුරජාණන් වහන්සේ

"මේ දිනවල එහි ඌරන් මැරීමක් නැත. චුන්ද සූකරික මිය යන්නට ළඟ ය. මැරෙන්නටත් පෙර ම ඔහු තමන් කළ පාප කර්මයට අනුරූප ව විපාක විඳියි. පණ තිබිය දී ම ඔහු අවීචි මහා නරකයෙ හි ම උපදී ය" යි වදාළහ.

එවිට භික්ෂූන් වහන්සේ

"මෙම පව්ටු ඌරු වැද්දා මෙලොව දී ත් ශෝකයෙන් පෙළී සිට, මරණින් පසුත් ශෝක කරන තැනක ම උපදින්නේ නොවේ දැ" යි ප්‍රකාශ කළහ.

ඉධ සෝචති පෙච්ච සෝචති
පාපකාරී උභයත්ථ සෝචති
සො සෝචති සො විහඤ්ඤති
දිස්වා කම්ම කිලිට්ඨමත්තනෝ ති

පව් කරන පුද්ගලයා මෙලොව ශෝක කරයි. පරලොව ද ශෝක කරයි. මෙලොව, පරලොව යන දෙලොව ම ශෝක කරයි. ඔහු තමා කළ කිලිටි කර්මය නිසා පරලොව ගිය කල්හි බොහෝ වූ අපා දුක් විඳිමින් විනාශයට පත් වන්නේ ය.

**ඌරුගමුවේ අස්සජී හිමි**



## වන්දනා ගමනක්

ඔබ මා හැර ගිය පසු
සැරයටිය ගත් මම
යළි
සිරිපා වඳිනු පිණිස
ගියෙමි
පුදුමෙක මහත
තැබූ පියවරක් පියවරක් පාසා
මහා සමනල කන්ද
මගේ දුක උරා ගෙන
මා සුවපත් කරයි

උදයංග අමරසේකර
ප්‍රංශයේ සිට




නිකිණි අමාවක පෝද

## දම් දෙසුම



# අනුන්ගේ වැරැදි ම පෙනෙන්නේ හිතේ වෛරය ඇතිවිට යි



හෝමාගම, පිටිපන දකුණ
මෙත්සිත් අරණ විවේක සෙනසුනේ
විහාරාධිපති,
පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනේ ආචාර්ය,
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති
**ලුණුගම්වෙහෙර නාරද හිමි**

**න අන්තලික්ඛේ න සමුද්දමජ්ජෙ**
**න පබ්බතානං විවරං පවිස්ස**
**න විජ්ජති සෝ ජගතිප්පදේසෝ**
**යත්ථට්ඨිතං නප්පසහේථ මච්චු.**

(ධම්මපදය - පාපවග්ග - 13 ගාථාව)

**කාරුණික පින්වතුනි,**

**අද පෝදා ධර්ම දේශනාවේ මාතෘකාව ලෙස තෝරා ගත්තේ සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ධම්මපදයේ ගාථාවක්. වටිනා දහම් කරුණු ඇතුළත් ධම්මපදය හඳුන්වන්නේ බෞද්ධයාගේ අත්පොත කියලයි. ධම්මපදය අවධානයෙන්, සිහිබුද්ධියෙන් කියවන ඕනෑම කෙනකුට තමන්ගේ ජීවිතය වෙනස් කරන දහම් පාඨයක් එහි කොතැනක හෝ අන්තර්ගත වෙලා තියෙන බව වැටහෙනවා. ඒ නිසා ඔබේ ආධ්‍යාත්මික දියුණුවේ අත්තිවාරම හැටියට මේ ධම්මපදය නම් ග්‍රන්ථය නිතර කියවන්න.**

පින්වතුනි, අද මාතෘකාගත දේශනාව ධම්මපදයේ පාප වග්ගයේ අවසන් ගාථාවයි. මේ ගාථා ධර්මය අපේ භාග්‍යවතුන් වහන්සේ දේශනා කළේ සුප්‍රබුද්ධ ශාක්‍ය රජතුමා මුල් කරගෙනයි. සුප්‍රබුද්ධ රජතුමා දේවදත්ත හාමුදුරුවන්ගේ ත් යශෝධරා දේවියගේ ත් පියාණන්. බුදුහාමුදුරුවන් ගේ මාමණ්ඩි. පින්වතුනි, සිහිපත් කර ගන්න, ලොවුතුරා බුදුරජාණන් වහන්සේ ගිහි කල උතුම් බෝධිසත්ත්වයන් ලෙස කොතරම් ගුණ සමුදායක් තිබුණ ද? ගිහි ගෙය හැරදමා සම්මා සම්බුද්ධත්වයට පත් වුණා ම අචින්ත්‍ය වූ, අවාච්‍ය වූ, අප්‍රමාණ වූ, අනන්ත වූ මහා ගුණයන්ගෙන් එක් බුදුගුණයක්වත් හඳුනා ගන්නට සුප්‍රබුද්ධ රජුට හැකියාවක් ලැබුණෙ නෑ. ඒකට හේතු වුණේ තම ප්‍රිය දියණිය වූ යශෝධරාව හැර දමා පැවිදි වීමත්, තම පුත්‍රයා වූ දේවදත්ත පැවිදි කරගෙන තනතුරු ලබා නොදී වෙනස්කම් කළා යැයි කාලයක පටන් සිතේ පැසවපු වෛරයයි. මේ වැරැදි අදහස් නිසා බුදුහාමුදුරුවන්ගෙ හොඳ පවා සුප්‍රබුද්ධ රජු දැක්කෙ වැරැදි විදියට. කවුරු හරි කෙනෙක් ගැන වෛරයක්, ද්වේෂයක්, තරහක් හිතේ පැසවනකොට පෙනෙන්නේ නම්, එයාගෙ වැරැදි පමණයි.

පින්වත්නි, මෙහෙම කාලය ගෙවිල ගියා. භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්පුර නිග්‍රෝධාරාමයේ වැඩ සිටින කාලයේ දවසක් එක්තරා සැදැහැවත් උපාසකයකු තමන්ගේ නිවසේ දානයට වඩින ලෙස බුදුරජාණන් වහන්සේ ඇතුළු මහා සංඝ රත්නයට ආරාධනා කළා. ඉතින් උන්වහන්සේ අනෙකුත් මහ සඟරුවන ද පිරිවරා දානයට වැඩම කරවන අතරතුර සුප්‍රබුද්ධ රජතුමා මාර්ගය අවහිර කළා. මේ වෙලාවෙ සුප්‍රබුද්ධ රජු අධික ලෙස රහමෙර පානය කරල හිටියෙ.

බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේ වඩින මඟ අහුරාගෙන සුප්‍රබුද්ධ රජු නිකං හිටියෙ නැහැ. 'බුදුන් මගේ බෑණා. වයසින් මට බාලයි. ඒ නිසා ඔහු ඉවත් වී මට ඉඩ දිය යුතුයි' ආදී වශයෙන් උන්වහන්සේට නොහොබිනා ලෙස බැණ වැදුනා. මේ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ ඉදිරියට වැඩම නොකර නතර වී සිටියා. ඉන්පසු ව බුදුරජාණන් වහන්සේ ආනන්ද හාමුදුරුවන් අමතා වදාරනවා 'ආනන්දය, සුප්‍රබුද්ධ රජතුමා කළේ ඉතාම නපුරු වැඩක්. බුදුවරයකු ගේ මඟ අවුරා සිටීම දරුණු අකුසලයක්. මෙහි ආදීනව වශයෙන් මෙයින් සත්වෙනි දවස ඔහුගේ මාළිගාවේ පොළොව පැළී නිරයේ උපදිනවා. එය වළක්වන්නට නොහැකියි".

බුදුරජාණන් වහන්සේ ගේ මේ ප්‍රකාශය සුප්‍රබුද්ධ රජතුමාට ආරංචි වුණා. ඔහු හොඳටම බය වුණා. දින හත ගෙවිල යනකම් කොහෙවත් නොගිහින් තමන්ගේ සත්මහල් ප්‍රාසාදයේ හත්වෙනි තට්ටුවට වෙලා කාලය ගත කළා. අපේ බණ පොත්වල සඳහන් වෙන විදියට එක මහලක දොරටුවක ආරක්ෂකයන් දෙදෙනකු ගානෙ යෙදෙව්ව. අමතක වීමකින් හරි රජතුමා පහළට ආවොත් නවත්වා ගන්න. රජුට ඉතා සමීප ව සේවය කළ දරුණු මැරයන් වැනි ආරක්ෂකයන් මාළිගාවේ ආරක්ෂාව භාර ව කටයුතු කළා.

හත්වන දවසේ රජු ගේ මඟුල් අශ්වයා කෝපයට පත්ව කෑගසමින් මහත් කෝලාහලයක් ඇති කළා. ඒ අශ්වයා හීලෑ වන්නේ රජතුමාට විතරයි. බොහෝ දෙනෙක් උත්සාහ කළත් අශ්වයා මෙල්ල කර ගන්න පුළුවන් වුණේ නෑ. පින්වත්නි, බලන්න අකුසල කර්මය විපාක දෙන විදිය. අන්තිමට රජුට බුදුන් වහන්සේගේ වචනය අමතක වෙලා පහළ මාලයට එන්න සූදානම් වුණා. වහල තිබුණ දොරටු ඉබේ ම විවෘත වුණා. ආරක්ෂකයන් නිසොල්මනේ හිටිය. රජතුමා පහත මාලයට අඩිය තබනවාත් සමඟ ම පොළොව පළාගෙන ගිනිදැල් මතුවෙලා රජතුමා නිරයට ඇදගෙන ගියා. මේ පුවත ඇසූ බුදුරජාණන් වහන්සේ අප මුලින් සඳහන් කළ මාතෘකා ගාථාවෙන් මරණයෙන් කිසිවකුටත් ගැලවිය නොහැකි බව සිහිපත් කරවමින් දම්සභා මණ්ඩපයට පැමිණ සිටි පිරිසට ධර්ම දේශනා කළා.

පින්වත්නි, ගාථාවේ තේරුම අපි විමසා බලමු.

අන්තලික්ඛේ – අන්තරීක්ෂයේ හෙවත් අහසේ, සමුද්ද මජ්ජෙ – මහ සයුර මැද

පබ්බතානං විවරං පවිස්ස – ගල් ගුහාවකට පිවිස , ජගති – මේ ලෝකයේ

යත්ථ – යම් තැනක , ඨිතං – සිටියේ නමුත් , මච්චු – මාරයාගෙන් ගැලවිය හැකි

සෝ පදේසෝ – එබඳු තැනක් , න විජ්ජති – විද්‍යමාන නොවේ, මච්චු – මාරයාගෙන්

නප්පසහේථ – ගැලවීමක් නැත.

පින්වත්නි, කාට වුණත් අහසේ, මුහුදේ, ගල් ගුහාවක හෝ වෙනත් කවර හෝ ආරක්ෂිත ස්ථානයක ඇඩි රැකවල් මැද සිටියත් මාරයාගෙන් ගැලවීමක් නැහැ. මරණයෙන් මිදෙන්න පුළුවන් කෙසඟක් පමණ වූ තැනක්වත් මෙලොව දැකිය නොහැකියි. මේ මරණ ධර්මතාව හොඳින් තේරුම් ගත්තොත් ඒ මොහොතට නිර්භය ව මුහුණ දීමට අපිට පුළුවන් වෙනවා. මෙලොව උගත් නූගත්, දුප්පත් පොහොසත්, ලස්සන අවලස්සන කාට වුණත් පොදු ධර්මතාව තමයි මරණය කියන්නෙ. බොහෝ කාලයක් ජීවත්වීමේ ආසාවෙන් විවිධ ආහාර පාන වර්ග, බෙහෙත්, ව්‍යායාම ආදී දේ කරමින් වෙහෙසුණත් මරණයෙන් බේරී සිටීමට බැහැ.

ධර්මයට අනුව මරණය සිදුවිය හැකි ආකාර 04 ක් තියෙන බව සඳහන් වෙනවා.

ආයුක්ඛය – ආයුෂ අවසන් වීමෙන් සිදුවන මරණය, කම්මක්ඛය – කර්ම ශක්තිය අවසන් වීමෙන් සිදුවන මරණය, උභයක්ඛය – ආයුෂය සහ කර්ම ශක්තිය යන දෙකම අවසන් වීමෙන් සිදුවන මරණය, උපච්ඡේදක – ආයුෂ සහ කර්ම ශක්තිය ඉතිරි ව ඇතත් හදිසි අනතුරු ආදී බලාපොරොත්තු නොවන ආකාරයෙන් සිදුවන මරණය

පින්වත්නි, මේ කියපු කාරණාවලින් එකකින් අපේ මරණය සිදුවීම නියත ධර්මතාවයක්. ඒ නිසයි බුදුහාමුදුරුවො දේශනා කළේ මහණෙනි, මිනිසුන්ගේ ආයුෂ ස්වල්පයයි. ඒකාන්තයෙන් පරලොව යා යුතුයි. ඒ නිසා කුසල් කරන්න. බ්‍රහ්මචර්යාවේ හැසිරෙන්න. ඉපදුණු අයට නොමැරී සිටීමට හැකියාවක් නැහැ. යමෙක් වැඩිකල් ජීවත් වුණත් ටික කාලයක් ජීවත් වුණත් මරණය ඒකාන්තයි යනුවෙන්.

පින්වත්නි, මේ ගතවෙන්නේ අපේ රටට පමණක් නොවෙයි, සමස්ත ලෝකයට ම මරණ බිය දැනෙන කාලයක්. නමුත් බුද්ධ ශ්‍රාවකයන් විදියට අප මරණයට බිය නොවිය යුතුයි. මරණයට නොබිය ව මුහුණ දිය හැකි ක්‍රමය බුදුහාමුදුරුවො දේශනා කළා. ජීවිතයේ අනිත්‍යතාව නිතර සිහිපත් කරන්න. තමන් රැස් කරන භෞතික සම්පත් සියල්ල කවදා හෝ හැරදමා යා යුතු බව තේරුම් ගන්න. ඉඩකඩම්, දේපළ, ධන සම්පත්, යාන වාහන ආදී සැප සම්පත්වලට ඇති අසීමිත තෘෂ්ණාව ටිකෙන් ටික අඩු කරන්න.

මීළඟ බුදු සරණ කලාපය බිනර පුර අටවක පෝද සැප්තැම්බර් 13 සඳුදා

# මිය ගිය ඥාතීන් වෙනුවෙන් ලබා දිය යුතු අග්‍රතම තිළිණය

**යම් කිසිවකුට පිරිනැමිය හැකි මහඟු තිළිණය ලෙස බුදු රජාණන් වහන්සේ වදාරා ඇත්තේ මිය ගිය ඥාතීන් වෙනුවෙන් පින්දහම් කිරීම හා එම පින අනුමෝදන් කරවීමයි.**

තව ද පින් අනුමෝදන් කරන්නා එ මගින් තවත් පින් රැස් කර ගන්නා බව ද උන්වහන්සේ වදාළ සේක. කුසල් කිරීමේ යෙදුණු විශේෂයෙන් ම "මහණ බමුණන්ට දන් දීමේ යෙදුණු අයට එම කුසල් තම මිය පරලොව ගිය ඥාතීනට අනුමෝදන් කරන ලෙස බුදුරදුන් ඔවුනට උපදෙස් දී ඇත. දන් දීමේ දී මියගිය ඥාතීන් වෙනුවෙන් දන් දීමට ද, දන් දෙනවිට මෙසේ සිහිපත් කරන ලෙස ද උන්වහන්සේ උනන්දු කළ සේක. එනම් ඔහු ජීවත් ව සිටියදී ඔහු මෙවන් සම්පත් මට දී ඇත. ඔහු මේ දේ මා වෙනුවෙන් කර ඇත. ඔහු මගේ අසවල් ඥාතියා ය. මගේ හවුල්කරු ය. යනාදී වශයෙනි.

තිරෝකුඩ්ඩ සූත්‍රය බුද්දකපාඨ

ඇඩීමෙන් පලක් නැත. දෙම්නස් වැළපීම්, ළතෝනි දීම්වලින් මළගියවුනට කිසිදු යහපතක් නො වන්නේ ය. මළ ගිය ඥාතීන් වෙනුවෙන් පින් අනුමෝදන් කරවීමේ පොදු විශ්වාසය පදනම් වී ඇත්තේ කෙනකු මිය ගිය විට ඔහු ගේ පින් පව් එකිනෙක ගෙන තුළනය කිරීමෙන් ඔහු ගේ ඉරණම තීරණය කිරීම ගැන ය. ඔහු ගේ ක්‍රියා කලාපය ඔහු යහපත් ස්ථානයක ප්‍රතිසන්ධිය ලබා ගනී ද, අයහපත් රාජධානියකට වැටේ ද යන්න තීරණය කරත් ම මිය ගිය අය ගේ ආත්මය, අනික් මිය ගිය අයගේ ආත්ම ඇති ලෝකයකට ගමන් කරන බව සමහර අයගේ විශ්වාසයකි.

පහත් ලෝකවල උපදින අයට අලුතෙන් පින් රැස්කර ගැනීමට නො හැකි ය. මෙලොව දී උපයා ගත් පින් මහිමයෙන් එහි ජීවත් විය යුතු ය. අනුනට හානි නො කර ජීවිත කාලය තුළ දී කුසල් රැස් කර ගත් අය නිරායාසයෙන් පහසු ස්ථානයන් හි උපත ලබන්නට වාසනාව ලබති. එවැනි අයට ජීවත් ව සිටින ඥාතීන් ගේ ආධාරය අනවශ්‍ය යි. කෙසේ වෙතත් සුවදායක ස්ථානයන් හි ඉපදීමට තරම් අවස්ථා නැති අය ජීවත් ව සිටින ඥාතීන් ගේ පින් ලබා ගැනීමට අපේක්ෂාවෙන් සිටින්නේ තමන් ගේ ඌණතාව සපුරා ගෙන සතුටුදායක වාසස්ථානයක ඉපදීමට හැකිවීම සඳහා ය.

අවාසනාවත් ආත්මභාවයන්හි පුනරුත්පත්තිය ලැබූවන් ඔවුන් ගේ වේදනාකාරී තත්වයන් ගෙන් මුදවාගත හැක්කේ තම මිතුරන් ඥාතීන් කරන්නා වූ කුසල කර්මයන්ගේ පින පවරා දීමෙන් හෙවත් අනුමෝදන් කිරීමෙනි. මිය ගිය ඥාතීන්ට පින් අනුමෝදන් කිරීමේ බෞද්ධ මතය පැරණි යුග සිසාර පැමිණි හින්දු සමයේ චාරිත්‍රයක අනුරූපයකි. මිය ගිය ඥාතීන් ගේ ආත්මයට සාමයෙන් ජීවත්වීමට විවිධ උත්සව පවත්වමින් ආධාර කරති. මේ චාරිත්‍රය ඇතැම් බෞද්ධ රටවල ද සමාජ ජීවිතයේ මහත් බලපෑමක් කෙරෙයි. කිසියම් යහපත් වැඩක් කළ කල්හි මිය ගිය අය සිහි කරති. බොහෝ විට එය කරනු ලබන්නේ ඔවුන් ගේ ජීවිත හා සම්බන්ධ අවස්ථාවල දී ය. එනම් උපන් දිනය හෝ අභාවය ස්මරණය කරන සංවත්සරවල දී ය. එවැනි අවස්ථාවල සාමාන්‍යයෙන් පවත්වනු ලබන පුද පූජා ද වෙයි. පවරන්නා හෙවත් අනුමෝදකයා යම් භාජනයකින් ජලය ගෙන වෙනත් භාජනයකට වත් කරමින් පාලි ගාථා කියයි. එහි අන්තර්ගත අදහස මෙසේ ය.

යම් සේ ගංගාවන් පිරී ගිය කල
වහා ගලා ගොස් මහ සමුදුරට වදී ද
එසේ ම මෙතනින් වැහෙන ජලය
ගලායන සේ
එහි සිටින මියගියවුනට ඵලදායි වේවා
උස් තැනින් වැගුරු මේ ජලය
පහළට වැගිරී යන සේ මේ දුන් පින
එහි සිටින ජීවීන්ට අත්වේවා
තිධිකණ්ඩ සූත්‍රය – ඛුද්දක පාඨ
පින් අනුමෝදන් කිරීමේ මූලාරම්භය

> **යම් සේ ගංගාවන් පිරී ගිය කල වහා ගලා ගොස් මහ සමුදුරට වදී ද**
> **එසේ ම මෙතැනින් වෑහෙන ජලය ගලා යන සේ**
> **එහි සිටින මිය ගියවුනට ඵලදායි වේවා**
> **උස් තැනින් වැගුරූ මේ ජලය පහළට වැගිරී යන සේ මේ දුන් පින එහි සිටින ජීවීන්ට අත්වේවා**



ධනය, මිය ගිය අය සිහි කිරීමේ උත්සව සහ පරිසාධනයන් සඳහා නාස්ති කෙරෙති. මේ පුද්ගලයෝ අධික වියදමින් භූමදානාගාර, සොහොන් කොත් තොරණ හා වෙනත් ආම්පන්න ගොඩ නැගීමෙන් මිය ගිය වුනට සෙතක් සැලසිය නො හැකි බැව් වටහා ගෙන නොමැත.

හඳුන්කූරු සුවඳ කඩදාසි දැල්වීමෙන් පරලොව ගිය අයට ආධාරදිය හැකි ද? නැතහොත් සත්ව ඝාතනය කරමින් සතුන් බිලි පූජාවලට යොදා ගනිමින් ආහාර පානාදිය දීමෙන් මිය ගිය ඇත්තනට පිළිසරණ විය හැකි ද? තව ද දුප්පතුනටදිය හැකි මිය ගිය ඇත්තන් පරිහරණය කළ දෑ ගිනි දෙවියනට පුද කිරීමෙන් මිය ගිය අයට සැලසෙන සෙතක් නැත. එය නාස්ති කිරීමක් පමණකි. මිය ගිය අයට උදව් විය හැකි එකම ක්‍රමය නම් ඔවුන් සිහි කර ආගමානුකූල ක්‍රමයකට කිසියම් කුසල ක්‍රියාවක යෙදීම ය.

එකී පුණ්‍ය ක්‍රියාවකට දන් දීම, පාසල් ගොඩනැගිලි ඉදිකිරීම, විහාරස්ථාන, අනාථ නිවාස, පුස්තකාල, ආරෝග්‍යශාලා, දහම් පොත් බෙදා දීම වැනි කටයුතු ඇතුළත් විය හැකි ය. බුදුරදුන්ගේ අනුගාමිකයන් නැණවත් ලෙස කටයුතු කළ යුතු ය. කිසිවකු අන්ධානුකරණය නො කළ යුතු ය. වෙනත් අය මිය ගියවුන් වෙනුවෙන් යාඥා පවත්වන අතර බෞද්ධයෝ ඔවුන් ගේ මෛත්‍රී සහගත චෛතසික තරංග මිය ගිය අය වෙත පතුරුවති.

පුණ්‍ය ක්‍රියාවල යෙදෙමින් එම පින් මිය පරලොව ගියවුන් ගේ සුබ සාධනය සඳහා අනුමෝදන් කෙරෙති. මිය ගිය අය ගේ නම පැවතීමටත්, ඔවුනට සැබෑ අන්දමින් හරසර දැක්වීමටත් හොඳම ක්‍රමය එය යි. ඔවුන් සුවපත් වූ විට මිය ගිය ඇත්තනට ද ඔවුන්ගේ ජීවමාන ඥාති මිත්‍රාදීනට ද ඒ අය ගේ ආශිර්වාදය ද අන්‍යොන්‍යකරණය ද සිදු විය හැකි ය. එබැවින් ජීවතුන් අතර සිටින ඥාතීන් ගේ යුතුකම වන්නේ පින් අනුමෝදන් කරවීමෙන් හා සෘජුව ම මෛත්‍රිය පැතිරවීමෙන් තම මිය පරලොව ගිය අය සිහිපත් කිරීම ය.

**ආචාර්ය කේ. ශ්‍රී ධම්මානන්ද නාහිමියන් ගේ what Buddhists Believe නම් ග්‍රන්ථයේ සිංහල පරිවර්ථනය**

**බෞද්ධ විශ්වාස විමර්ශනය කෘතිය ඇසුරිනි**



## මිනිසා හදාගෙන රට හැදීම

"මිනිසා නො හදා රට හදන්නට බැහැ. මිනිසාත් හදාගෙන රටත් හදාගනිමු" යනුවෙන් මගේ රටට දැයට පරම පූජනීය වූ මඩිහේ සිරි පඤ්ඤාසීහ මහ නාහිමිපාණෝ නිරතුරුව ම පෙන්වා දුන්හ.

"නො මැරෙන මිනිසකු සේ මුදල් උපයන්න. නො මැරෙන මිනිසකු සේ ඉගෙනීමෙහි යෙදෙන්න. අධ්‍යාපනය ලබන්න. එහෙත් මාරයා කෙස් වැටියෙන් අල්ලා සිටින අවස්ථාවක සේ ධර්මයේ හැසිරෙන්න."

යනුවෙන් කරුණාවෙන් අවවාද කළහ.

## වචනයක ගැඹුර

දිනක් නායක ස්වාමීන් වහන්සේ නමක් මා හට භාවනා කමටහනක් ලබා දෙමින් අවවාද කළේ "මම මැරෙනවා, දැන් මැරෙනවා" යනුවෙන් සිතමින් සිත පුහුණු කරන ලෙසට යි.

අපට කුඩා කල එහි ගැඹුර නො දැනුණි. එහෙත්, වයසින් හා මනසින් වැඩෙත් ම එලෙස සිහිපත් කරයි නම්, කොතරම් හොඳින් ඉරියව් පාලනය කරමින් ජීවිතය හැඩගස්වා ගැනීමට නුවණ මුහුකුරා ගිය අයකුට හැකියාව ඇත්ද? අද බොහෝ දෙනකු මේ යතාර්ථයෙන් ඈත් වී සිට, බුද්ධියේ නිම් වළලු පුළුල් කරනු වෙනුවට මෝහයේ ම ඇලී වැනසීම සංවේගජනක ය.

## නුග ගස හා නුග පල

නුග ගස මහත් වුව එහි පල කුඩා ය. ඇතැම් මිනිසුන් ද එසේ ය. ධනයෙන්, බලයෙන්, වස්තුවෙන් ආඪ්‍යය. එහෙත් අදහස්වලින් ලාමක ය. සිතුම් පැතුම් තේරීම නුග පල සේ කුඩා ය. පිරුණු මිනිසකු උදාර පුරුෂාර්ථයෙන් සිය දිවිය පුරවා ගත යුතු ය. ඒ සඳහා යන මග උතුම් ශ්‍රී සදහම් මාවතයි.

**රාස්සගල චන්දකිත්ති හිමි**

# පින් ලබා දීම අර්ථවත් ද?




කොළඹ මහානාම විද්‍යාලයේ
ආචාර්ය
කොලොන්නාව
පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ
ධම්මින්ද හිමි**

**බුදු දහමට අනුව පින් අනුමෝදන් වීම සහ අනුමෝදන් කිරීම යන අවස්ථා දෙක ම පින්කම් ය. වර්තමාන ජීවිතයේ දී බොහෝ කෙනකු සිත් තැවුලට පත් කරන කාරණය වන්නේ තම මියගිය ඥාතීන්ට පින් අනුමෝදන් කිරීමට ඇති ප්‍රායෝගික ගැටලුවයි. විශේෂයෙන් මෙම වසංගතය හමුවේ දී බොහෝ ආගමික චාරිත්‍ර, පුණ්‍යානුමෝදනා පෙර සේ සිදු කිරීම ගැටලුවකි.**

ඒ මත ඇතැමෙක් ඉච්ඡා භංගත්වයට, මානසික පීඩාවට පත්ව ඇත. ඇතැම් විට එය එසේ වනුයේ පින්දීම පිළිබඳ යතාර්ථය නිවැරැදි ව අවබෝධ නොවීමෙනි.

පින් අනුමෝදන් කිරීම පටු සීමාවක, පියවි ඇසට පෙනෙන මානයෙන් සිදු විය යුත්තක් සේ අප නො සැලකිය යුතු ය. උදාහරණයක් ලෙස දේහය සමීප ව තබා ගෙන පාංශුකූල වස්ත්‍රය පූජා කිරීම හෝ දේහය නැතිව එම කාර්යය සිදු කිරීම යන අවස්ථා දෙක ම සමාන ය. පින් ලැබීම හෝ නො ලැබීම සිදු වන්නේ ඒ මත නොවේ.



**'පින් අනුමෝදන් කිරීම පටු සීමාවක, පියවි ඇසට පෙනෙන මානයෙන් සිදු විය යුත්තක් සේ අප නො සැලකිය යුතු ය. උදාහරණයක් ලෙස දේහය සමීප ව තබා ගෙන පාංශුකූල වස්ත්‍රය පූජා කිරීම හෝ දේහය නැතිව එම කාර්යය සිදු කිරීම යන අවස්ථා දෙක ම සමාන ය. පින් ලැබීම හෝ නො ලැබීම සිදු වන්නේ ඒ මත නොවේ.'**

සාංඝික දානය වුව ද නිවැසියන් ම එකතු ව තම නිවසේ ම සිදු කිරීමේ අවශ්‍යතාවය හෝ දින හතෙන් ම සිදු කිරීමට අත්‍යවශ්‍ය නොවේ. පින් ලැබීම නොලැබීම ඒ මත තීන්දු නොවේ. එහි නියම ධර්මානුකූල පැත්ත මනාව තේරුම් ගැනීම වර්තමාන සමාජයට ඉතා වැදගත් ය. කාල, දේශ, අවස්ථා අනුව කටයුතු සංශෝධනය කර ගැනීම දියුණු දර්ශනයක ස්වභාවය යි.

බුදුරදුන් නිරන්තර ව දේශනා කළේ ලෝක වජ්ජය, පඤ්ඤත්ති වජ්ජයට යටත් විය යුතු බව ය. මෙහි දී ලෝක වජ්ජය යනු රටක මූලික ප්‍රධාන නීතියයි. පඤ්ඤත්ති වජ්ජය යනු ආගමික ඉගැන්වීම්, අනෙක් පැනවීම් ආදිය යි. මෙ වැනි ව්‍යසනයක දී සම්ප්‍රදාය පවත්වා ගෙන පැමිණි සිරිත් සංශෝධනය කර ගත යුතු ය. බුදු දහම එවැනි නම්‍යශීලී ඉගැන්වීමක් බව අමුතුවෙන් පැහැදිලි කර දිය යුතු නොවේ. වර්තමාන භාවිතය තුළ ලෝකයට ම එය සක්සුදක් සේ පැහැදිලි ය. මෙවන් ශ්‍රේෂ්ඨ වූ දර්ශනයක පින් අනුමෝදන් වීම පිළිබඳ පැහැදිලි ඉගැන්වීමක් ඇතුළත් ය.

මෙහි දී වැදගත් වන්නේ පින් අනුමෝදන් කරන ආකාරය නොවේ.

අ. නි. ප්‍රේත දාන හෙවත් ජානුස්සෝණිය සූත්‍රයේ දී මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් සිදු කෙරේ.

ජානුස්සෝණිය බමුණා බුදුරදුන් සමීපයට පැමිණ විමසුවේ, තථාගතයන් වහන්ස, අපි බ්‍රාහ්මණයෝ වෙමු. මේ දානය පරලොව ගිය ඥාති හිතවතුන්ට පින් ලැබේවා යි පරිත්‍යාග කරනු ලැබේ. එම දානයෙහි ආනිසංස ඔවුන්ට ලැබෙන්නේ ද? යනුවෙනි. එහි දී තථාගතයන් වහන්සේ දේශනා කළේ ස්ථානයෙහි ලැබේ. අස්ථානයෙහි නොලැබේ යනුවෙනි. මෙහි දී ජානුස්සෝණිය ස්ථානය මොකක් ද, අස්ථානය මොකක් ද යනුවෙන් ප්‍රශ්න කිරීමේ දී පින් ලැබෙන නො ලැබෙන අවස්ථා ගණනාවක් දේශනා කළහ.

අවසානයේ දී බුදුරදුන් දේශනා කළේ පින් අනුමෝදන් නොවුණ ද කරන ලද පින් නො නැසෙන බව ය. එනම් පින් කරන ලද කෙනාට එය පිහිට පිණිස පවතී යනුවෙනි. මෙහි දී පින් ලැබෙන නො ලැබෙන තැන් තථාගතයන් වහන්සේ විස්තර කළහ. මේ ලෝකයෙහි යමකු සතුන් මරන්නේ ද, නුදුන් දේ ගන්නේ වේ ද, කාමයෙහි වරදවා හැසිරෙන්නේ ද, බොරු, කේලාම්, පරුෂ වචන, ප්‍රලාප දෙඩන්නේ වේ ද, දැඩි ලෝභකම ඇත්තේ වේ ද, කෝප වූ සිත් ඇත්තේ වේ ද, මිත්‍යාදෘෂ්ටික වේ ද, එවන් අය මරණින් පසු නරකයෙහි උපදී. නරකයෙහි සත්වයන්ගේ යම් ආහාරයක් වේ ද හෙතෙම ඉන් යැපෙයි. ඔවුනට ලබා දෙන පින් අනුමෝදන් නොවේ. මෙය අස්ථානය යි.

එමෙන් ම පෙර සඳහන් කරන ලද සියලු පාප කර්මයන් සිදු කර ඇතැමෙක් මරණින් පසු තිරිසන් අපායට වැටේ. තිරිසන් යෝනියෙහි සත්වයන්ට යමක් ආහාර වේ ද ඔවුන් ඉන් යැපේ. ඔවුන්ට ලබා දෙන පින් අනුමෝදන් නොවේ.

ඉහත දැක් වූ සියලු අකුසල කර්මවලින් ඉවත් ව, පෙර යම් පිනක් මත යමකු මිනිසත් බවයක් ලබා ගනී. එසේ වුව ද ඔවුනට එම පින් අනුමෝදන් නොවේ. එය ද අස්ථානයයි. ප්‍රාණඝාතය, නුදුන් දේ ගැනීම ආදී අකුසල වෙනුවට කුසල සම්පත්තීන් දියුණු කොට මරණින් පසු දෙවියන් අතර උපදී. එහි දී දෙවියන්ට යමක් ආහාර වේ ද ඉන් හෙතෙම යැපෙයි. ඔවුනට ලබා දෙන පින් අනුමෝදන් නොවේ. මෙය ද අස්ථානයයි.

යමෙක් මේ ලෝකයෙහි දස අකුසල් සිදුකොට මරණින් පසු ප්‍රේත ලෝකයෙහි උපදී.

ප්‍රේත යනු අනුන්ගේ පින මත යැපෙන පිරිසකි. එහෙයින් එවන් අයට ඔහුගේ මිත්‍රයෙක්, ඥාතියෙක් ලබා දෙන පින් අනුමෝදන් විය හැකි ය. එය ස්ථාන යයි. ඔවුන් ද පින් නො ලබන්නේ නම්, වෙනත් ප්‍රේත කොටස් අනුමෝදන් වේ. එසේ ද අනුමෝදන් නොවුණ ද දායකයාට ඒ පින් නිෂ්ඵල නොවේ.

තව දුරටත් මෙහි දී තථාගතයන් වහන්සේ දේශනා කළේ ඇතැමෙක් ප්‍රාණඝාත ආදී පාප කර්ම සිදු කර ජීවිතය ගෙන ගිය ද ඒ අතර ශ්‍රමණ බ්‍රාහ්මණාදී දන් ලබාදිය යුතු පිරිස් වෙනුවෙන් විවිධ පූජාවන් සිදු කිරීමේ ප්‍රතිඵල මත ඇතුන් අතර උපදී. එහි දී ආහාරපාන නොයෙක් මල්මාලා පූජාවන් හිමිවේ. එය වර්තමාන ජීවිතයේ දී ද ඉතා හොඳින් දැකිය හැකි ලක්ෂණයකි. විශේෂයෙන් නැදුන්ගමුවේ රාජා, ඉන්දිරාජා, වැනි හස්තීන් දෙස බැලීමේ දී ඒ තත්ත්වය පැහැදිලි වේ.

ඉහත දැක් වූ පාප කර්ම සිදු කොට ඒ අතර පින්කම් සිදු කිරීම මත අශ්වයන් අතර උපදී. එහි දී විවිධ ගෞරව සත්කාර ලැබෙනු ඇත. මේ ආකාරයෙන් ගවයන්, සුනඛයන් වී උපදී. අනෙක් ගවයන්ට සුනඛයන්ට වඩා ඒ තුළ බොහෝ සැප පහසුකම් විඳීමට පෙර පින ඒ සත්වයන්ට මග හෙළි පෙහෙළි කරදීම දැකිය හැකි ය. එසේ ම යම් මිනිසකු දස කුසල ධර්මවල යෙදීමත් සියලු පාපයන් දුරු කිරීමත් මත ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට විවිධ දානමාන සිදුකිරීම තුළින් මිනිසුන් අතර උපදී. එහි දී අන්‍ය මිනිසුන්ට වඩා සැප පහසුකම් සහිත ව උපත ලැබීමට ඔවුන් සමත් වේ. එමෙන් ම මෙවන් යහපත් දෑ සිදු කොට දාන ධර්මාදිය සිදු කිරීම නිසා ඇතැමෙක් දෙවියන් අතර උපදී. එතන දී අනෙක් දෙවියන්ට වඩා මහේශාක්‍ය දෙවියකු ව කටයුතු කිරීමේ භාග්‍ය උරුම වේ. මේ කුමන තත්වයක දී වුව ද කරන ලද පින් අනර්ථකර නොවේ. අර්ථ සම්පන්න වේ.

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069
නිකිණි අමාවක 2021.09.06

## රැකවරණය ඇති තැන...

ජීවිතයේ දුක් කරදර, විපත් පැමිණෙන්නේ නොසිතූ ලෙසට ය. මෑත කාලීන ඉතිහාසය දෙස ආපස්සට හැරී බැලූවේ නම් අඩ සියවසක කාලය පුරා අප මොන තරම් අනපේක්ෂිත සිදුවීම්වලට මුහුණ දී තිබෙනවා ද?

වර්තමානයේ මුහුණ දී තිබෙන අභාග්‍ය සම්පන්න වසංගත රෝග ව්‍යසනය ම මොන තරම් පීඩාකාරී ද? එසේ වූ වා යැයි කළකිරීමට පත් ව ජීවිතයෙන් මඟ හැර යන්නට නොහැකි ය. සැපයට සේ ම දුකට ද මුහුණ දෙන්නට සිදු වන බව බෞද්ධයන් වන අපට අමුතුවෙන් කියා දිය යුතු නැත. අවශ්‍ය වන්නේ ඕනෑම අවස්ථාවකට නොසැලී මුහුණ දීමේ හැකියාව ඇති කර ගැනීම ය. ඒ සඳහා පෙර සූදානම ය.

විශේෂයෙන් මෙම උවදුරත් සමඟ අප ආර්ථික ම ය වශයෙන් බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දෙනවා විය හැකි ය. සරල ව, සැහැල්ලුවෙන්, ලද දෙයින් සෑහීමකට පත් ව ජීවත් වන්නට හුරු පුරුදු වී සිටියා නම් මෙවැනි දුෂ්කර අවස්ථා වුව ද සැනසීමෙන් ගෙවා දමන්නට ඉඩ තිබුණි. බොහෝ දෙනකු අසහනයට පත් ව සිටින්නේ එවැනි තැනකට සිත පුරුදු නොකළ නිසා ය. අනෙක් අතට ආර්ථික කළමණාකරණයක් නොමැතිකම ය. සරල ව කියනවා නම්, හම්බ කරන දේ නිසි ලෙස වියදම් නොකිරීම ය.

බොහෝ දෙනෙක් පවසන්නේ හම්බ කරන සොච්චමෙන් එදිනෙදා ආහාර වේලවත් පිරිමසා ගන්නට බැරි බව ය. එහි වරද වියදම් කරන ක්‍රමයේ ය. ඉවසීමෙන්, සිතා බැලූවේ නම් අප බොහෝ වියදම් කොට ඇත්තේ අවශ්‍ය යැයි සිතා අනවශ්‍ය දේට ය. එක්කෝ අනුන් කරන දේ කරන්නට ය. එසේත් නැති නම් ලෝකයට පෙනෙන්නට ජීවත් වන්නට ය.

ජීවිතයෙන් ම අපට පාඩම් ඉගෙන ගත හැකි ය. මෙතෙක් ආ ගමන් මඟ දැන් හෝ වෙනස් කර ගත යුතු ව ඇති බව පැහැදිලි ය. අප ගේ තේරීම අනවශ්‍ය දේ නොවුණොත්, අවශ්‍ය දේ ද නොවුණොත්, අත්‍යවශ්‍ය දේ පමණක් වුව හොත් එතැන සුරක්ෂිත වන්නේ ආර්ථිකය පමණක් නොවේ. අනාගතයට මුහුණ දීමේ සැහැල්ලුව යි.

දියුණුව ළඟා කර ගත හැකි සහනශීලී ආර්ථික සැලසුම් ක්‍රමවේදයක් බුදුරජාණන් වහන්සේ අපට හඳුන්වා දී තිබේ. උපයන ප්‍රමාණය කොපමණ ද, එය කොටස් හතරකට බෙදා එදිනෙදා පරිබෝජනයට ගත යුතු ඉන් එක් කොටසක් පමණි. කොටස් දෙකක් ජීවනෝපාය ක්‍රමවේදයේ දියුණුව සඳහා ය. අනෙක් කොටස හදිසියක දී, ලෙඩක දී, කරදරයක දී ගැනීමට ය.

එදිනෙදා වියදම් අතර ඉතිරියක් ගැන කවර කතාදැ යි කෙනකුට සිතීම අසාධාරණ නොවේ. එහෙත් අසීරුවෙන් හෝ එතැනට යා යුතු ම ය. ඉතා දුෂ්කර වුව ද ඒ අත්හදා බැලීම තුළ මාස කිහිපයකින් තමන් ගේ ආර්ථිකය ගැන විශ්වාසයක් ගොඩනැඟීම අසීරු නොවේ.

මේ සඳහා අවශ්‍ය ස්ථිර අධිෂ්ඨානයක් හා ඕනෑකම යි.

එමෙන් ම ඇතැම් කෙනෙක් පුරුදු වී සිටින්නේ තමන් මුහුණ දෙන දුෂ්කරතාවන්ට වග කිව යුතු අන් අය බව ය. චෝදනා, දෝෂාරෝපණ නො අඩු එහෙයිනි. එහෙත් තමන්ට පිහිට තමන් ම ය. තමන් ගේ ආරක්ෂාව සලසා ගත යුතු තමන් ම ය. කිසිවකුට චෝදනා කළ පමණින් යමකුගේ අඩුපාඩු සම්පූර්ණ වන්නේ නැත. සුවදායී ජීවිතයක් ගොඩනඟා ගැනීමේ මඟ අප ගේ ශාස්තෘන් වහන්සේ අපට දේශනා කොට තිබේ. ඒ ගමන් මඟ ධර්මානුකූල ය. දෙලොවට ම වැඩ දායක ය.

# දුක් කරදරවලට මුල තමන් ගේ සිතිවිලි ම ය

**සැවැත් නුවර ආනන්ද නම් ඉතා ධනවත් සිටුවරයෙක් විසී ය. ඔහුට අසූ කෙළක් ධනය තිබුණ ද කිසිවකුට කිසිවක් දෙන්නට මැළි විය. තම පුතු මූලසිරි අමතා ඔහු නිතර ම කීවේ,**

"මේ මහා විශාල ධනයකැයි නොසිතන්න. ඔබට ඇති කිසිවක්, කිසිවකුට නොදිය යුතු ය. ඔබ කළ යුතු ධනය තව තවත් වැඩි කිරීම යි. නැතහොත් ඉතා ඉක්මනින් මේ ධනය නිම වනු ඇත. නිවෙසේ බිම රන් පිරවූ මැටි බඳුන් පහක් නිදන් කරගෙන සිටි ඔහු මිය ගියේ ඒ වා තිබුණු බවක් වත් කිසිවකුට හෝ නොපවසමිනි.

මිය ගිය ආනන්ද සිටුවරයා සැවැත් නුවරට ආසන්නයේ එක් සිඟන පිරිසක උපන්නේ ය. ඔහු උපදින්නට පෙර මව් කුස සිටිය දී සිඟන්නන්ට ලැබෙන ආදායම අඩු විය. කවුරු හෝ අවාසනාවන්තයකු තමන් අතර ඇතැයි ඔවුහු සිතූහ. ඒ අනුව කණ්ඩායම කොටස්වලට බෙදමින් අවාසනාවන්තයා අයත් කණ්ඩායම තනි කරන ක්‍රමයට ඔහු ගැබ් ගත් පවුල තනි කර ගත්හ.

ඔවුන් ගමෙන් පළවා හරින ලදී. ඔහු උපන්නේ අවලස්සන විකෘති දරුවකු ලෙසිනි. ඔහු ගේ කිසිම ඉන්ද්‍රියයක් පිහිටිය යුතු තැන නියම විදිහට නො පිහිටියේ ය. බැලූ බැල්මට පාංශු පිශාචයකු බඳු වූ මේ දරුවා සමඟ සිඟා ගිය දාට කිසිවක් නො ලැබේ. තනිව ගිය විට යමක් ලැබෙයි.

එහෙත් මව තම දරුවා ඇඩි දුක් විඳ ඇති දැඩි කළා ය. දරුවා තරමක් වැඩෙන තුරු පෝෂණය කොට තනි ව යමක් කර ගන්නා තරමට වැඩුණු පසු ඔහු අතට කොළපතක් දුන්නා ය.

"පුත, අප මේ ව්‍යසනයට වැටුණේ නුඹ නිසා ය. දැන් ඉතින් මම ඇති තරම් දුක් විඳ හෙම්බත් ව සිටිමි. මේ කොළපතත් අරගෙන සිඟා කා ජීවත් වන්න" යැයි පැවසුවා ය.



සැවැත් නුවර සිඟා යන අතරතුර ඔහුට හිටිහැටියේ තම පෙර ජන්මය හා ඒ ජන්මයේ නිවෙස සිහිපත් විය. ඔහු ඒ නිවෙස සොයා ගියේ ය. ඔහු ගේ පෙර ජන්මයේ පුත් මූලසිරි ගේ දරුවෝ ඔහු දැක බියෙන් හඬන්නට පටන් ගත්හ. එහෙයින් ඔහුගේ සේවකයෝ ඔහු ගෙයින් බැහැරට එළවූ හ.

පිඬු සිඟා වඩිමින් සිටි බුදුරජාණන් වහන්සේ මේ සිදුවීම දුටුවහ. උන්වහන්සේ ආනන්ද හමියන්ලවා මූලසිරි කැඳවූ හ.

මේ හිඟන කොලුවා ඔබේ පෙර ජන්මයේ පියා යැයි බුදු රජාණන් වහන්සේ මූලසිරිට පැවසූහ. එහෙත් ඔහු එය පිළි නො ගත්තේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ හිඟන දරුවා අමතා රන් කළ පහ වළලා ඇති තැන දක්වන්නැයි ඉල්ලා සිටියේ ය. ඒ අනුව කොලුවා රන් කළ පහ පෙන්වී ය. ඉන්පසු මූලසිරි ඒ තම පියා බව පිළිගත්තේ ය. මහත් කම්පනයට පත් ව මූලසිරි බුද්ධ ශ්‍රාවකයෙක් බවට පත් විය.


**පුත්තාමත්ථි ධනංමත්ථි**
**ඉති බාලො විහඤ්ඤති**
**අත්තා හි අත්තනො නත්ථි**
**කුතෝ පුත්තා කුතෝ ධනං**

මට පුතුන් ඇත මට ධනය ඇත
සිතා අනුවණ දනෝ වෙහෙසෙත
කවර පුත්තු ද? කවර ධනය ද?
තමන් පිහිටට තමන්වත් නැත.

මට දරුවෝ සිටිති. මට ධනය තිබේ . ආදි වශයෙන් සිතමින් අඥාන පුද්ගලයා වෙහෙසෙයි. එහෙත් අඩු ගණනේ තමන්ට තමන්වත් නැත. පුත්තු හා ධනය කෙසේ ද?


බුදු රජාණන් වහන්සේ මේ ගාථාව දේශනා කොට වදාළේ වේළුවනාරාමයේ දී ආනන්ද නම් වූ මසුරු සිටුවරයකු නිමිති කරගෙන ය.

> මට පුතුන් ඇත මට ධනය ඇත සිතා අනුවණ දනෝ වෙහෙසෙත කවර පුත්තු ද? කවර ධනය ද? තමන් පිහිටට තමන්වත් නැත



සිංගප්පූරුවේ
ප්‍රධාන සංඝනායක
වේරගොඩ සාරද නා හිමි

# ඇතොත් අනුවණකම
# දකිමු වනසන අයුරු දෙලොව ම



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනයේ
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**

**අවාරි ජාතකය**

**බුදුරජාණන් වහන්සේගේ දේශනාව අනුව ලොව මිල කළ නොහැකි අමිල වස්තුව ප්‍රඥාව යි. මිනිසත් බව ලබන, මෙ ලොව උපදින සියලු මිනිසුන්ට ප්‍රඥාවක් හිමිවෙයි. ඥානය, නුවණ, බුද්ධිය යනු මෙයට තවත් නම් කිහිපයකි. මනුෂ්‍යයකු ලෙස උපත ලබන්නේ රජ මැදුරේ ද, සිටු මැදුරේ ද, පැල්පතේ දැ යි වෙනසක් නැත. සියලු දෙනාම සමාන මනුෂ්‍ය ලක්ෂණවලින් යුක්ත ය. එහෙත්, රජ මැදුරේ උපන්නත්, වෙනත් උසස් යැයි හෝ පහත් යැයි සමාජය විසින් සම්මත කර ගත් කවර ස්ථානයක උපත ලැබුවත් ප්‍රඥාවෙන් යුක්ත නම්, ඔහු හෝ ඇය ලොව අමිල වස්තුවක් ය.**



**දවසක් ජේතවනාරාම මහා විහාරයට බොහෝ දුර පිහිටි දුෂ්කර ග්‍රාමයක වැඩවාසය කළ භික්ෂූන් වහන්සේ නමකට මෙසේ අදහසක් පහළ වුණා.**

සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් දේශිත සද්ධර්මය ශ්‍රවණය කිරීමෙන් සහ ප්‍රායෝගික ව ක්‍රියාවට නැඟීමෙන් මම ජීවිතයේ සත්‍යය අවබෝධ කර ගත්තා. මාගේ මිතුරු භික්ෂූන් වහන්සේලා ත්, උපාසක උපාසිකා පිරිසත් බුදුරජාණන් වහන්සේ දෙනෙතින් දැක බලා ගෙන, උන්වහන්සේ විසින් දේශනා කරන සද්ධර්මය ශ්‍රවණය කර මහත් සේ ප්‍රීතියට පැමිණෙනවා. ඒ නිසා මමත් හෙට ම බුදුරජාණන් වහන්සේ දැකීමට පිටත් වෙන්න ඕනි යැයි සිතා ඒ භික්ෂුව පාන්දරින් ම ගමන ආරම්භ කළා. ගව් ගණනක් පයින් ම ජේතවනාරාමය වෙත පැමිණෙන්නට වුණා. ජය ගත යුතු ලොකු ම අභියෝගය අචිරවතී ගංගාවෙන් එතෙර වීමයි. මධ්‍යහ්න සමයේ පැමිණියත් සවස් වෙන තෙක් ම පාරුවේ අවස්ථාවක් ලබා ගැනීමට නො හැකි වුණා. පැමිණි පිරිස පිළිවෙලින් එතෙර කිරීම එයට හේතුවයි. අවස්ථාව උදා වූ සැණින් පාරුවට නැඟි තෙරුන් වහන්සේ "තොටිය, මා ගඟෙන් එතර කරවන්න, මම ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ බැහැ දැකීමට යන ගමනකි මේ" යැයි පැවසුවා. එවිට තොටියා කියන්නේ "ස්වාමිනි, දැන් බොහෝ ම රෑ වෙලා, හෙට උදෑසන ගියහොත් ඔබ වහන්සේට බුදුරජාණන් වහන්සේ දැකීමට පුළුවනි" යැයි පිළිතුරු දුන්නා. එවිට භික්ෂුව කියන්නේ

"පුරුෂය, තවමත් කල් වේලා ඇත. උන්වහන්සේ බැහැ දැකීමට ඒ නිසා වහා මා එතෙර කරවන්න, රාත්‍රිය උදා වුව හොත් සැතැපීමට තැනක්වත් සොයා ගැනීමට මෙතැන නැතැ"යි පැවසුවා. එයින් කෝප වූ තොටියා පාරුවට ගොඩකරගත් තෙරුන් වහන්සේ ගංගාව මැදට ගෙන ගොස් ගොඩවිය යුතු තොටුපොළෙන් ගොඩ නො කර, ගංගාවේ පහළට පාරුව මෙහෙයවා, පහළ තොටුපොළකින් එතෙර කළා. තෙරුන් වහන්සේ අදාළ තොටුපොළින් ගොඩවීමට කොතෙක් ඇවටිලි කළත් ඔහු එය සිදු කළේ නැ.

තෙරුන් වහන්සේ ගේ සිවුර ද ජලයෙන් තෙමී ගියා. ගංගාවේ එගොඩට පැමිණි තෙරුන් වහන්සේ පය ඉක්මන් කරමින් විහාරයට ගොඩ වුවත් බුදුරජාණන් වහන්සේ දැකීමට නො හැකි වුණා. රාත්‍රිය විහාරයේ ගත කළා. සිවුර වේලා ගත්තා. පසුදින දම් සභාවට පැමිණ බුදුරජාණන් වහන්සේට වන්දනා කර තමන් වහන්සේ අසවල් ප්‍රදේශයෙන් වැඩම කළ බව පැවසුවා. එකල්හි බුදුරජාණන් වහන්සේ "ඔබ වහන්සේ කවරදිනක ද පැමිණියේ? යැයි විමසුවා. එකල්හි ඊයේ රාත්‍රියේ පැමිණි බවත්, සිවුර තෙත බරිත වූ හෙයින් බුදුරජාණන් වහන්සේ බැහැ දැකීමට නො පැමිණි බවත්, සිදු වූ සෙසු පුවත් ද ප්‍රකාශ කළා. එය අසා සිටි බුදුරජාණන් වහන්සේ භික්ෂුවගේ සිත සනසමින්

"පින්වත් භික්ෂුව, අචිරවතී නදියේ පාරු මෙහෙයවන නැවියා මෙ කල පමණක් නොවෙයි, පෙර එක් ආත්මයක මටත් ඔය විදිහට ම කළා. අඥාන බව එකලත් තිබුණා. එය ඔහුගේ සසර පුරුද්දක්" යැයි පැවසුවා.

එම පුවත අසනු රිසි වූ දම් සභාවේ සිවුවනක් පිරිස ම බුදුරජාණන් වහන්සේට නමස්කාර කර අතීත කතාව දේශනා කිරීමට ආරාධනා කළා. බුදුරජාණන් වහන්සේ අවාරි ජාතකයේ අතීත කතාව මෙසේ දේශනා කරන්න පටන් ගත්තා.

පින්වත් මහණෙනි, මම පෙර එක් ආත්මයක බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනකු රාජ්‍ය කරන සමයෙහි තාපස පැවිද්දෙන් හිමාලය පර්වතයේ වාසය කළා. සති දෙකකට හෝ තුනකට සැරයක් ලුණු මිරිස් ආදී ඉවුම් පිහුම් කළමනා ගෙන යාමට නගරයට පැමිණීමේ පුරුද්දක් තිබුණා. දිනක් රජතුමාගේ උද්‍යානයේ දිවා කාලය ගත කරන විට රජතුමා මුණ ගැසී ඔහු මාවෙතින් ධර්මය ශ්‍රවණය කළා. එදින සිට එහි ම වාසය කරන්න ආරාධනා ලැබුණා. මහණෙනි, මමත් රජතුමාගේ ආරාධනාව අනුව වසර දෙළසක් එහි සිටියා. රජතුමාට අර්ථයෙන්, ධර්මයෙන් අනුශාසනා කළා. රජතුමා එයින් පැහැදී විශාල නියම් ගමක් පූජා කළා. මම එය පිළිගත්තේ නැහැ. එහෙත් රජතුමා ද එය නැවත ගත්තේ නැහැ. රජතුමාගේ කාරුණික අනුග්‍රහය මගේ ගමනට බාධාවක් වුණා. එබැවින් උද්‍යාන පාලකයාට පවසා මා එයින් බැහැර වුණා. රජතුමාට එය දැන්වූවා නම් මට යාමට ඉඩ දෙන්නැති බව මම දැනගෙන සිටියා. උද්‍යානයෙන් පිටවී හිමාලයට නැවතත් යන අදහසින් අචිරවතී ගංගාව සමීපයට ගියා. එදින මට හමු වූයේ මේ භික්ෂුවට හමුවුණ තොටියා ම තමයි. ඔහු මිනිසුන් එගොඩට ගෙන ගියා. එගොඩ පිරිස මෙගොඩට ගෙන ආවා. එතෙරදී මිල දෙමි. යැයි පවසමින් මිනිසුන් ඔහු වංචා කරමින් එගොඩ මෙගොඩ ගමනාගමනය සලසා ගත්තා. ඔහු අඥාන බවින් පිරී සිටියා. මම එතැනට ගිය විට මගෙන් ද මුදල් ඉල්ලුවා. එකල්හි මම "තොටියාණෙනි, මම ඔබට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරමි" යැයි පැවසුවා. ඔහුත් එය මුදලක් යැයි සිතා නිශ්ශබ්ද ව එගොඩට පාරුව මෙහෙයවා එගොඩ දී මුදල් ඉල්ලා සිටියා. එවේලේ "තොටියාණෙනි, ලෝක සත්ත්වයාට ම මෛත්‍රිය වඩන්න, ඔබ එතෙරදී ම මිනිසුන්ගෙන් මුදල් ගන්න. එසේ නො කරන නිසා මිනිස්සු ඔබ වංචා කර නොමිලයේ ම ගමන් පහසුව සලසා ගනිති. මිල අරගෙන විනා එතෙර නො කරන්න" යැයි අනුශාසනා කළා. නිශ්ශබ්ද ව සිටි ඔහු

"තොප මට දෙන වස්තුව දෙව" යි කියමින් මුදල් ඉල්ලා සිටියා.

මම ඔබට නැවට ගොඩවෙන මොහොතේ ම පැවසුවේ මා සමීපයේ මුදල් නැත. අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා පමණක් ම කරන බව යි. පොරොන්දුව අනුව එය ඉටු කළා" යි පැවසුවා. එයින් කෝප වූ ඔහු මට පහරදීමට පටන් ගත්තා. එතැනට දුවගෙන පැමිණි තොටියා ගේ බිරිඳ,

"හිමියාණෙනි, මේ රජතුමාට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන තාපසයාණෝ ය. එබැවින් පහර නො දෙන්න"යි ඉල්ලා සිටියා. බිරිඳගේ හඬින් තවත් කෝප වූ හෙතෙම තාපසයාට පහරදීම නතර කර බිරිඳට පහර දුන්නා. ඇය දරු ගැබක් දරා සිටි තැනැත්තියක්. ඇය වහා ඇද වැටුණා. දරුවත්, බිරිඳත් එයින් ම මිය ගියා. ගමේ මිනිසුන් එතැනට පැමිණ රාජ පුරුෂයන් ලවා අල්වාගෙන මිනීමරුවකු ලෙසින් රජතුමාට ඉදිරිපත් කළා. රජතුමා නඩු තීන්දුව ප්‍රකාශයට පත් කරමින් මරණ දණ්ඩනය නියම කළා. ඔහුගේ අඥාන බව නිසා තම ජීවිතයත්, බිරිඳත්, උපත ලැබීමට සිටි තම දරුවාත්, තාපසයා ගේ ඇසුරත්, මිනිසුන් ගේ ඇසුරත් අහිමි වුණා. දෙලොව ම පරාජයට පත් වුණා යැයි පවසමින් බුදුරජාණන් වහන්සේ අවාරි ජාතක දේශනාව සමාප්ත කළා. එකල නැවියා නම්, අද මේ භික්ෂුවට හමු වුණ නැවියා ම ය. බරණැස් රජ්ජුරුවෝ නම් මෙකල ආනන්ද මහ තෙරුන් ය. තාපස ව සිටියේ ලොව්තුරා සම්මා සම්බුදු රජුන් වන මම් ම යැයි පූර්වාපර සන්ධි ගැළපීම ද සිදු කළා.

> **"පින්වත් භික්ෂුව, අචිරවතී නදියේ පාරු මෙහෙයවන නැවියා මෙ කල පමණක් නොවෙයි, පෙර එක් ආත්මයක මටත් ඔය විදිහට ම කළා. අඥාන බව එකලත් තිබුණා. එය ඔහුගේ සසර පුරුද්දක්"**

## මාතෘ භූමිය ආරක්ෂා කළ ශ්‍රේෂ්ඨ නායකයාට කෘතගුණ දැක්වූවා මිස

# මා කිසි විටෙකත් දේශපාලනය කළේ නැහැ



**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ කෝට්ටේ කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ බස්නාහිර පළාතේ ප්‍රධාන සංඝනායක නාරාහේන්පිට අභයාරාමාධිපති ආචාර්ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.**

**මුරුත්තෙට්ටුවේ ආනන්ද හාමුදුරුවො යන නාමය මේ රටේ බාල, මහලු, ගිහි, පැවිදි නොදන්නා කෙනෙක් නැති තරම්. හැම කෙනෙක් ම වාගේ ඔබ වහන්සේ දන්නවා, හඳුනනවා. මේ වගේ උදාර පැවිදි ජීවිතයක් වශයෙන් ප්‍රව්‍රජිත වීමට ඔබ වහන්සේ ගේ පැවිදි ජීවිතයේ ආරම්භය සිදුවුණේ කොහොමද ? අපේ නායක හාමුදුරුවනේ**

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ මුරුත්තෙට්ටුව කියන බොහොම ස්වභාවික සුන්දරත්වයෙන් අනූන ගැමි පරිසරයක ජන්ම ලාභය ලැබුවා. මගේ පියා ජීවනෝපාය වශයෙන් කෘෂි කර්මාන්තය කරගෙන ගියා. ඔහු දරුවන්ට බොහොම ආදරය කරුණාව දැක්වූවා වගේ ම ඉතාමත් ආදර්ශවත් පීතෘත්වයකින් යුතු චරිතයක් වුණා. මගේ පියාණන් වහන්සේ වගේ ම, මෑණියන් වහන්සේත් බොහොම ශ්‍රද්ධාවන්ත ගුණගරුක මව්පිය දෙපළක්. අපේ පවුල සහෝදර සහෝදරියන් හතර දෙනකුගෙන් සමන්විතයි. මම කුඩා කාලයේ දී මුරුත්තෙට්ටුව යෝගම මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා ගත්තා. එම කාල පරිච්ඡේදයේ දී ම 1954 වර්ෂයේ දී පත්බේරියේ ධම්මාලෝක නායක මා හිමිපාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් කිරුළපන පූර්වාරාම විහාරස්ථානයේ දී මුරුත්තෙට්ටුවේ ආනන්ද යන ශාසනික නාමයෙන් උතුම් ප්‍රව්‍රජ්‍යා භාවයට පත්වුණා. අනතුරුව නාරාහේන්පිට අභයාරාම විහාරස්ථානයේ නේවාසික ව වැඩ සිටිමින් මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙන තුළින් ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය ලැබුවා. එම කාල වකවානුවේ දී ම 1958 වර්ෂයේ දී කෝට්ටේ කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ මහානායක ධූරන්දර මොල්ලිගොඩ අරියවංශ මහානායක මා හිමිපාණන් වහන්සේගේ හා පත්බේරියේ ධම්මාලෝක නායක හිමිපාණන් වහන්සේගේ ආචාර්ය උපාධ්‍යායත්වයෙන් කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභා සීමා මාලකයේ දී උතුම් වූ උපසම්පදා පුණ්‍යකර්මය සිදු වූ බව පුණ්‍යානුමෝදනා පූර්වක ව සිහිපත් කළ යුතුයි. එවකට වැඩසිටි මහා පඬිවරුන්ගේ ඇසුර ලැබීමෙන් පැවිදි ජීවිතයට විශාල ආලෝකයක්, ශක්තියක් ලැබුණ බවත් කෘතවේදී ව මේ අවස්ථාවේ සිහිපත් කළ යුතුයි.

ඒ වගේ ම කුඩා කාලයේ සිටම සමාජය වෙනුවෙන් උදව් උපකාර කිරීමට කැපවුණ ස්භාවයක් මා සතු ව පැවතුණා. ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය අවසන් වීමත් සමඟ සමාජ සේවා කටයුතු සඳහා දායක වුණා. ගරාවැටෙමින් තිබුණ නාරාහේන්පිට අභයාරාම විහාරස්ථානය සැදැහැවතුන් ගේ උදව් උපකාර ලබා ගෙන ප්‍රතිසංස්කරණය කරමින් පූජනීය වන්දනීය විහාරස්ථානයක් බවට පත්කිරීමට ඒ කාලයේ සිටම කටයුතු කළා.

**ඔබ වහන්සේ හෙද සංගමයේ සභාපති ධූරයට පත්වීම පිළිබඳ එදත් අදත් විවාදාපන්න මාතෘකාවක් බවට පත්ව තිබෙනවා. මේ සම්බන්ධ ඉතිහාසය පැහැදිලි කරන්න අපේ හාමුදුරුවනේ,**

එක්දහස් නවසිය හැට ගණන්වල මම අසනීප ව රෝහල්ගත වුණ අවස්ථාවක හෙද නිලධාරීන්ට උදාවෙලා තිබුණ දුක්ඛිත තත්ත්වය තේරුම් ගත්තා. හෙද සේවකයන් වහලුන් බවට පත්වෙලා තිබුණා. ඔවුන්ට දවසේ පැය විසි හතර ම සේවය කළ යුතු ස්වභාවයක් පැවතුණේ. පැය 12 ක දවල් සේවයත්, පැය 12 ක රාත්‍රී සේවයත් තිබුණා. මගේ නායකත්වයෙන් බිහි කළ රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමයේ පුරෝගාමීත්වයෙන් එම සියල්ල වෙනස් කරමින් හෙද සේවය රටේ පිළිගන්නා ගෞරවනීය සේවයක් බවට පත්කිරීමට කටයුතු කළා. ඒ තුළින් ඔවුන් වරප්‍රසාද ලබන පිරිසක් බවට පත්වුණා. එදා සිට වර්තමානය දක්වා ම එහි ක්‍රියාකාරී ව කටයුතු කරගෙන යනවා. එපමණක් නොවෙයි මහා කරදර කලබල පැවතුණ කාලවකවානුවල වෛද්‍ය විද්‍යාලය තුළ ඇතිවුණ දුක්ඛදායක තත්ත්වයන් සමනය කිරීමට නායකත්වය ලබා දුන්නා.




**මේ රටේ ජාතික ,ශාසනික , ආගමික, දේශපාලනික , ක්‍රියාදාමයන්ට පුරෝගාමීත්වය ලබාදුන් ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් කටයුතු කළ ඔබ වහන්සේගේ එම සේවාව පිළිබඳ ව සඳහන් කරනවා නම්, නායක හාමුදුරුවනේ,**

සුනාමිය,මහා ජල ගැලීම්, ත්‍රස්තවාදී විපත් ආදී වශයෙන් මේ රට ජාතික ව්‍යසනයකට මුහුණ දුන් සෑම අවස්ථාවක දී ම පෙරමුණ ගෙන එයට නායකත්වය ලබාදෙමින් කටයුතු කළා. ශාසනික වශයෙන් ගරාවැටෙමින් තිබුණ නාරාහේන්පිට අභයාරාම විහාරස්ථානය කොළඹ නගරයේ ප්‍රධාන විහාරස්ථානයක් බවට පත් කළා. දහම් පාසල් ආරම්භ කරමින් දරුවන් ගේ දහම් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමටත්, උදව් උපකාර අවශ්‍ය පාසල් දරුවන් වෙනුවෙන් පොත්පත් අධ්‍යාපන උපකරණ බෙදා දෙමින් ,කැපකරු දායකත්වය ලබා දෙමින් ඔවුන් අධ්‍යාපනික වශයෙන් දිරිමත් කළා. ඒ වගේ ම දුප්පත් ජනතාව වෙනුවෙන් නිවාස ඉදිකරමින්, විශාල සහන ලබාදීම අප්‍රකට ව සිදුකළා මිසක් කිසිවක් ප්‍රසිද්ධියේ සිදුකළේ නැහැ. ජාතික ආගමික ශාසනික සමාජීය කටයුතු සිදු කරන්නට යෙදුණේත් අප්‍රකට ව යි. පසුකාලීන ව ප්‍රසිද්ධියට පත් වුණා.

මම කිසිම අවස්ථාවක කිසිදු රජයකින් පෞද්ගලික උදව් උපකාර ලබා ගෙන නැහැ. සෑම අවස්ථාවක දී ම අපේ කාලය, ධනය , ශ්‍රමය වැය කරමින් ජාතික වගකීම් ඉෂ්ට කළා පමණයි. එදත්, අදත් හෙටත් ඒ ආකාරයෙන් ම කටයුතු කරනවා මිස වෙනසක් වෙන්නේ නැහැ .

ඒ වගේ ම 1956 වර්ෂයේ දී මේ රටේ ඇතිවුණ මහා විප්ලවය ජයග්‍රහණය කිරීම සඳහා හේන්පිටගෙදර ඤාණසීහ නායක හිමියන්, බද්දේගම විමලවංශ නායක හිමියන්, කොටගම වාචිස්සර නායක හිමියන් ආදී ගෞරවනීය මහා සංඝරත්නය සමඟ එක්ව උන්වහන්සේලාට සහයෝගය සඳහා සෑම අවස්ථාවක දී ම සංවිධාන ශක්තිය ලබා දීමට කැපවීමෙන් කටයුතු කළා. ජනතාවට දුකක් විපතක් වුණ සෑම අවස්ථාවක දී ම කටයුතු කළා පමණක් නොවෙයි, 1986 වර්ෂයේ දී මහා වැඩ වර්ජනය තිබුණ අවස්ථාවේ දීත් අභයාරාම විහාරස්ථානය මූලික කරගෙන ඔවුන්ට සහනයක් වීමට දායක වුණා.

ඒ වගේ ම දෙමළ ත්‍රස්තවාදයෙන් මාතෘ භූමිය මර බියෙන් වෙළාගෙන බෞද්ධ සිද්ධස්ථාන විනාශ කරමින්, ගරුතර මහා සංඝරත්නය ඝාතනය කරමින්, අහිංසක පුරවැසියන් විනාශ කරමින් පැවතුණ කාල වකවානුවේ දීත් පවුල් 1500ක අසරණ ජනතාවක් වසර 2ක කාලයක් විහාරස්ථානය තුළ රඳවාගෙන ඔවුන්ට ආහාර පාන ලබා දෙමින් ඔවුන්ගේ අවශ්‍යතා සොයා බැලීමට වග බලා ගත්තා පමණක් නොවෙයි, මව්පියන් නැති දරුවන් වෙනුවෙන් ශිල්ප ආයතනය නමින් සමාජ සේවා ආයතනයක් බිහිකරමින් එම දරුවන් සඳහා රැකවරණය හා අධ්‍යාපන පහසුකම් ලබා දුන්නා. ඒ තුළින් වෛද්‍යවරුන් පවා බිහිවෙලා තිබෙනවා. දිළිඳු ජනතාව වෙනුවෙන් නිවාස විශාල ප්‍රමාණයක් ලබා දීමටත්, සුනාමිය නිසා පීඩාවට පත් ව සිටි ජනතාව වෙනුවෙන් නිවාස විශාල ප්‍රමාණයක් ඉදිකර දීමටත් කටයුතු කළා.

මහා සංඝරත්නය,බෞද්ධ සිද්ධස්ථාන, අහිංසක පුරවැසියන් විනාශ කරමින් දෙමළ ත්‍රස්තවාදීන් මේ රට මහා විපතකට ඇද දැමුවා. ත්‍රාසයෙන්, මර බියෙන් ගිනි ගනිමින් වසර 30 ක් පුරා පැවතුණ යුද්ධය අවසන් කරමින් මේ රටට නිදහසක් ලබා දුන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමා යි. මේ රටට නිදහස ලබා දුන් ශ්‍රේෂ්ඨ නායකයකු වශයෙන් එතුමාට කෘතගුණ සැලකීමක් කළ යුතුයි. අපේ බොහෝ අකෘතඥ මිනිසුන්ට යුද්ධය පැවතුණ ඒ කාල පරිච්ඡේදය මතක නැහැ. බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වය ලබා ගෙන මුලින් ම කියා දුන් පාඩම වුණේත් කෘතගුණ සැලකීමයි. එම නිසා නාරාහේන්පිට අභයාරාම විහාරස්ථානය මූලික කරගෙන දෙමළ ත්‍රස්තවාදයෙන් මාතෘ භූමිය ආරක්ෂා කළ ශ්‍රේෂ්ඨ නායකයකු වුණ මහින්ද රාජපක්ෂ මැතිතුමාට කෘතගුණ සැලකුවා මිස මා කිසිවිටෙකත් දේශපාලනයක් සිදු කළේ නැහැ.

ඒ වගේ ම බොහෝ අවස්ථාවල දී මා විසින් සිදු කරන්නට යෙදුණ ජාතික, ආගමික, ශාසනික, සේවය ඇගයීමට ලක්වුණා. කොරියාව ,ඉන්දියාව යන රටවලින් පිරිනමන ලද ආචාර්ය ගෞරව උපාධියෙන් පිදුම් ලැබුවා වගේ ම මැලේසියාවේ විශ්ව විද්‍යාලයකින් සම්මාන ආචාර්ය උපාධියක් ලබා දීමට කටයුතු කළා. විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙන් ශ්‍රී සුමංගල විද්‍යාවතංශ ගෞරව නාමය, විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයෙන් ජන හිත ශාසන රත්න විභූෂණ ගෞරව නාමය, බෞද්ධයා රූපවාහිනී මාධ්‍ය ජාලයෙන් ප්‍රශස්ත සේවා ඇගයීම් ප්‍රණාම උපහාර, කෝට්ටේ කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවෙන් ශාසන කීර්ති ශ්‍රී ධම්මාලෝක ගෞරව නාමය ආදී වශයෙන් මා විසින් සිදු කළ සේවය විශාල ලෙස ගෞරවාදරයට පාත්‍ර වුණා.

හේමමාලා රන්දුනු

# සිතට දැනෙන බර නිසා ඔබත් පීඩාවෙන් ද? සැහැල්ලු වන්නේ මෙහෙමයි

**"මගේ හිතේ මහා බරක් තියෙනවා. ඒ මොකක් ද කියලා මට තේරෙන්නේ නෑ". බොහෝ දෙනකුට මෙවැනි හැඟීම් ඇති වූ අවස්ථා බොහොමයක් තිබෙන්නට පුළුවන්.**

දෑතේ, හිසේ හෝ උර මත තිබෙන බරක් නම් බිමින් තබා නිදහස් වන්නට පුළුවන්. ඒ ත් හිතේ තිබෙන බරක් කෙසේ නම් බිමින් තබන්න ද?

සිතට බරක් දැනෙන්නේ අප අකැමැති සිතිවිලිවලින් සිත පිරී තිබෙන විටයි. එය බොහෝ අවස්ථවන් හි ජීවිතය කළකිරීමට පත් කරනවා.

ඒ වගේ ම තමන් කැමැති දේ සිත තුළ තැන්පත් වූ විට සිතට දැනෙන සැනසීම මොනතරම් ද? එවන් අවස්ථාවක දී අපේ සිතට දැනෙන්නේ, "මගේ හිතට ලොකු සැහැල්ලුවක් දැනෙනවා" වැනි හැඟීමක්.

මෙලෙස අපට නොපෙනෙන එහෙත් දැනෙන, හැඟෙන සිතිවිලි විටෙක හිතට බරකුත්, තවත් විටෙක සැහැල්ලුවකුත් ගෙන දෙනවා. ඒත් බර ඔසවාගෙන ඉන්නට කැමැති කවුද? සැමදෙනා ගේ ම බලාපොරොත්තුව සැහැල්ලුව යි.

සිත සැහැල්ලුවෙන් තබා ගැනීම කියන්නේ තමන් කැමති ආකාරයෙන් සිතිවිලි පවත්වා ගැනීමයි. තමන්ගේ ම සිතිවිලි තමන්ට ම බරක් නොවී තබා ගැනීමට නම් සිතේ හා සිතිවිලිවල සැබෑ ස්වභාවය මැනවින් තේරුම් ගන්නට ඕනෑ.

ඇතැම් විටෙක සිතට බරක් දැනෙන්නේ අප කළ කී දේ ගැන ආපස්සට හැරී බලන විටයි. ලෝවැඩ සඟරා කතුවරයා එය ලස්සනට පැහැදිලි කරනවා.

කරන කලට පව් මීරිය මී සේ
විඳින කලට දුක් ඇඩිවෙයි ගිනි සේ

පව් මොනවාද කියලා අප දහම තුළින් ඉගෙන ගෙන තිබෙනවා. එහෙමත් නැති නම් ලෝක සම්මතයට අනුව දැන ඉගෙන තිබෙනවා. ඒත් සමහරු දැන දැනම පව් කරනවා. ඉතින් දුක් විපාක ලබනවා. එය සිතට බරක් ම මිස සැහැල්ලුවක් වන්නේ කෙසේ ද? ඒමොහොතේ දුකක් නොදැනුණත් පසුව කළ දේ ගැන පසුතැවෙනවා. මේ දුක් සමූහයා ඉතිරි කරන්නේ මහා බරක්. ඒ බර ටිකෙන් ටික ජීවිතය දුකට පත් කරනවා. පවක් වේවා, සමාජ සම්මත නොකටයුත්තක් වේවා සතුටින් සිදු කළ ත්, පසුව ඒ දේ මතකයට නැඟෙන විට, තමා කළේ වරදක් යැයි හැඟෙන විට සිතට මහත් වදයක් වෙනවා. සිතේ ඇති වන සියලු ම පසුතැවීම්වලට වඩා තමන් පවක්, අකුසලයක් කළා යැයි යන හැඟීම මහා බරක් ලෙස දැනෙනවා.

බොහෝ දෙනෙක් සිතන්නේ ඒ බරින් නිදහස් වන්නට නොහැකි බවයි. ඒ සිතිවිල්ල නිවැරැදි නෑ. අධිෂ්ඨානයක්, ඕනෑකමක් තිබෙනවා නම් ඕනෑම කෙනෙකුට සිතේ බර බිමින් තබන්නට පුළුවන්. ඒ වැරැදි නිවැරැදි කර ගෙනයි. දාන,ශීල හා භාවනා දී පින්කම්වලට යොමුවීමෙනුයි.

බුදු දහමට අනුව යම් අකුසලයක් කළේ නම් එහි අනිටු විපාකයන්ට මුහුණ දිය යුතු ම යි. එසේ නම් කළ යුතු වන්නේ නැවතත් එම අකුසලය නොකරන බවට දැඩි අධිෂ්ඨානයෙන් යුතුව කුසල් මඟ අනුගමනය කිරීම යි. දාන, ශීල, භාවනා යන පින්කම්වලට යොමු වීමයි. මේ ආකාරයෙන් කටයුතු කිරීමේ දී සිතට සහනයක් දැනෙනවා. සිතේ බර ටිකෙන් ටික අඩු වෙනවා.





බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායේ ලෝණඵල සූත්‍රයේ දී දැක් වූ උපමාවක් තිබෙනවා, එයට අනුව

මහා ජලාශයකට ලුණු අහුරක් එක් කළ ද එහි ලුණු රසයක් ඇති වන්නේ නෑ. ඒ ත් කුඩා වතුර භාජනයකට ලුණු අහුරක් එක් කළ විට එහි ලුණු රසය දැනෙනවා. එසේ ම නිරන්තරයෙන් කුසලයට යොමු වූ පුද්ගලයකුගෙන් කලාතුරකින් ස්වල්ප වූ අකුසලයක් සිදුවුයේ නම් එහි විපාක අනිටු ලෙස විපාක දීමට ඇති අවස්ථා අඩු බවයි.

මෙම කරුණ කිසිවිටකත් වරදවා තේරුම් නොගත යුතුයි. ඒ, ජීවත්වන කාලයේ වැඩිපුර ම පස්පව්, දස අකුසල් කරමින් සිට කලාතුරකින් දානයක් දීමෙන් කළ සියලු අකුසලයන්ගෙන් නිදහස් විය නොහැකි බවයි. දානයේ යහපත් විපාකය යටපත් කරගෙන නිරතුරුව ම සිදු කරන පස්පව්, දස අකුසල් හි අනිටු විපාක මතුවිය හැකි යි. ඒ නිසා නිරතුරු ව ම කුසලයට යොමු ව යහ පැවැත්මක් ඇති කර ගැනීම අවශ්‍යය යි.

නිරතුරු ව ම අප තුළ ආත්මායනය මුල් කර ගෙන "මම, මගේ" නම් වූ සිතිවිලි පහළ වෙනවා. ඒ නිසා ලෝභ, දෝස, මෝහ නම් වූ අකුසල සිතිවිලි උපදිනවා. ලෝභය කියන්නේ "මම" කියා හෝ "මගේ" කියා හෝ තෘෂ්ණාවෙන් යුතු ව බාහිර අරමුණු අල්ලා ගැනීම යි. ඒ ත් අප තේරුම් ගත යුතු දෙයක් තිබෙනවා. ඒ මෙලොව පවත්නා සියලු වස්තූන් අනියත බවයි. "මගේ" හෝ "මම කැමතියි" යනුවෙන් අල්ලා ගත් හෝ අල්ලා ගන්නට උත්සාහ ගන්නා වස්තූන් ද මොහොතක් පසා වෙනස් වෙනවා. මේ වෙනස් වීම පණ ඇති වස්තූන් මෙන් ම පණ නැති වස්තූන්ට ද එක හා සමානයි. ඒ වගේ ම සිතෙහි හටගන්නා සිතිවිලි ද වෙනස් වෙනවා. ඒ ත්

ආශාවෙන් අල්ලා ගත් හෝ අල්ලා ගන්නට උත්සාහ කරන හෝ වස්තූන් ගේ වෙනස්වීම පිළිගන්නට "මමත්වය" නම් උඩඟු සිත කැමති නෑ. මේ නිසා සිත නිරතුරු ව ම උත්සාහ කරන්නේ වෙනස් වන සියල්ල නොවෙනස් වන අයුරින් දකින්නට යි.

මේ සිත කවර ආකාරයෙන් "මගේ, මගේ" කියා අල්ලා ගන්නට උත්සාහ කළත් වස්තූන් හි ස්ථිර පැවැත්මක් නෑ. සිතේ ඇති වන මේ ගැටුම බොහෝ කෙනකුට තේරුම් ගත නොහැකි යි. ඒ නිසයි බොහෝ කෙනෙක් පවසන්නේ "මගේ සිතේ ලොකු බරක් තියෙනවා." "මගේ ඔළුව අවුල්වෙලා" යනුවෙන්.

මේ ඔළුවේ බර බලාපොරොත්තු කඩවීමක්. නැති නම් යම් බලාපොරොත්තුවක් ඉටු කර ගන්නේ කෙසේදැයි සිතන සිතිවිල්ලයි. එසේත් නැති නම් තමන් ප්‍රිය අයකුගේ වෙන්වීමයි.

අප ලෝක ව්‍යවහාරයට අනුව "මගේ" යැයි ආමන්ත්‍රණය කළ ද, පරමාර්ථයට අනුව හැබෑවට ම "මගේ" යැයි කීමට පණ ඇති හෝ පණ නැති කිසිවක් නැති බව සිතන්නට සිත පුරුදුකළ යුතු ම යි. එවිට ජීවත් වන ලෝකයේ සම්මුතියට අනුව කුමන අයුරිකින් කටයුතු කළ ද, බලාපොරොත්තු ඇති කර ගැනීමේ දී, බලාපොරොත්තු කඩවීමේ දී, ප්‍රියයන්ගෙන් වෙන්වීමේ දී පමණක් නොව තරහව, වෛරය, ඊර්ෂ්‍යාව ආදී සිතිවිලිවල දී පවා අස්ථිර ලෝකයක අස්ථිර පැවැත් ම සිතට දැනෙන්නට පටන් ගන්නවා. සිතක ඇති වෙන්නා වූ අමනාප හා කරදරකාරී සිතිවිලි ද ඇති වූ ආකාරයෙන් ම නැතිව යන බව සිතිවිලිවල වෙනස්වීම තුළින් ම අවබෝධකර ගැනීම ආරම්භ වෙනවා. එවිට,

සිතේ බර ගතිය හේතුවෙන් කිසිවක් සිතා ගන්නට බැහැයි පැවසූ ඔබට බරක් නොවූ සන්සුන් සිතකින් ප්‍රශ්නයට පිළිතුරු සොයන්නට අවස්ථාව උදා කර ගත හැකි වෙනවා.

මඩේ සිටිමින් ම ශරීරයේ මඩ සේදීමට උත්සාහ කරනවා යැයි සිතන්න. තව තවත් මඩ තැවරෙනවා මිස මඩ සේදී යන්නේ නෑ. සිතේ බර ද එසේ ම යි. අප අමනාප හෝ අසතුටු සිතිවිලි හෝ සිතෙහි රඳවා ගෙන සිටින තාක් කල් සිතේ ඇතිවන බරෙන් නිදහස් විය නොහැකි යි. අමනාප සිතිවිලි අත්හැරීමත් සමඟම යි සිතේ බර ගතිය පහව යන්නේ.

ලාබ, අලාබ, යස, අයස, නින්දා, ප්‍රශංසා, දුක, සැප කියන ලෝක ධර්මතා අටට අප සියල්ලන්ට ම මුහුණ දීමට සිදු වෙනවා.

මේ දුක් මට පමණක් ඇයි නොසිතිය යුතුයි. බෞද්ධ ප්‍රතිපදාව අනුව දුක්, කරදර බාධා විපත් ඉදිරියේ නිරවුල් මනසක් පවත්වා ගැනීමට හැකිතාක්දුරට උත්සාහ කිරීම යි වැදගත්. දුක මෙන් ම ප්‍රශ්න ඉදිරියේ සිතට බරක් කර ගත යුතු නෑ. සිත නිදහස් ව පවත්වා ගෙන දුකින් නිදහස් වන මඟ අනුගමනය කළ යුතු යි.

මනුෂ්‍ය ජීවිතයක් ලැබීම ඉතා දුලබ බවයි බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ. ඒ ජීවිතය සුව සේ පවත්වා ගැනීමට මඟ උන්වහන්සේ අපට පෙන්වා දී තිබෙනවා. ඒ මඟ යනවා නම් සිතට බරක් නොවී සැහැල්ලුවෙන් ජීවත් වන්නට පුළුවන්.

දීපා පෙරේරා

ලක්දිව සංඝරාජ පදවිය 3

# මල්වතු අස්ගිරි මහානායක හිමිවරුන්ගේ වගකීම්



මල්වතු මහා විහාරයේ උපෝෂථාගාරය ඇතුළත



මල්වතු මහ නාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් උපසම්පදා විනය කර්මයක් සිදු වන අවස්ථාවක්



අස්ගිරි මහ නාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් උපසම්පදා විනය කර්මයක් සිදු වන අවස්ථාවක්

කීර්ති ශ්‍රී රාජසිංහ මහ රජතුමන් විසින් සංඝරාජ පදවිය පත් කළ අවස්ථාවේ දී ම මල්වතු අස්ගිරි උභය මහා විහාරයීය මහා නායක පදවි ආරම්භ කෙරිණි. මෙම පදවි ඉතා වැදගත් වන්නේ මහා විහාර දෙකෙහි චිරස්ථිතිය හා මේවා අතර සම්බන්ධතාවය ඇති වූ නිසා ය. ශාසනික වශයෙන් ශ්‍රී ලාංකේය මහාවිහාර වංශික භික්ෂු පරපුර ධර්ම විනය, ශබ්ද ශාස්ත්‍ර, වත් පිළිවෙත් යනාදිය ආරක්ෂා කර ගැනීමේ වගකීම මෙම උත්තරීතර පදවියට පැවරුණි. ශ්‍රී දළදා සමිඳුන් ආරක්ෂා කොට ගෙන පුද පූජාදිය පවත්වාගෙන යාමත්, අවශේෂ පෞරාණික සිද්ධස්ථාන සහ සියලු සිද්ධස්ථානයන් ආරක්ෂා කර ගැනීම පිළිබඳ වගකීමත් මහානායක පදවියට පැවරී තිබේ. එමෙන් ම ජාතික ඉතිහාසයෙහි ඓතිහාසික සම්බන්ධතාවය මූර්තිමත් කෙරෙමින් වර්තමානයෙහි වුව ද සිංහල ජාතියෙහි අති පූජනීය අනුශාසකයාණෝ මහා නාහිමියෝ වෙති.

මල්වතු පාර්ශ්වයේ මහානායක පදවිය සතු බලතල රාශියකි. මහනුවර උපෝෂිත සහ පුෂ්පාරාම විහාරද්වයෙහි විහාරාධිපතිත්වය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ හොබවති. රටේ වැඩිම විහාරස්ථාන සහ භික්ෂූන් වහන්සේ අයත් වනුයේ ද මල්වතු මහාවිහාර පාර්ශ්වයට ය. එසේ ම ස්‍යාමෝපසම්පදාවෙන් පසු උපසම්පදාව පිහිටුවූ ස්ථානය වීම, සියම් නිකායේ අනෙක් පාර්ශ්වයන් මල්වතු මහා විහාරයේ උපසම්පදාව ලද භික්ෂූන් වහන්සේලා විසින් පිහිටුවීම, අමරපුර රාමඤ්ඤ දෙනිකාය පිහිටුවීමට මුල් වූ හිමිවරුන් ද මල්වතු මහා විහාරය ඇසුරින් ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය කොට පැවිදි උපසම්පදා ලද හිමිවරුන් ගේ සිසුන් වීම වැනි හේතු මත ලක්දිව අත්‍යන්ත සංඝ මූලස්ථානය මල්වතු මහා විහාරය ලෙස හඳුන්වා දිය හැකි ය.

අනුරාධපුර අටමස්ථානය, කැලණිය, ශ්‍රීපාදස්ථානය, දීඝවාපිය, තිස්සමහාරාමය, කතරගම, සිතුල්පව්ව, පැල්මඩුල්ල රජමහා විහාරය, රිදී විහාරය, කුණ්ඩසාලේ, තොටගමුව ඇතුළු විහාරස්ථාන රාශියක් මල්වතු පාර්ශ්වයට අයත් ය. විද්‍යෝදය, විද්‍යාලංකාර දෙපිරුවන් ආරම්භ කොට පෙරදිග මහා තක්ෂිලාවන් බවට පමුණුවන ලද්දේ ද මල්වතු පාර්ශ්වයේ මාහිමිපාණන් වහන්සේලා විසිනි.

මල්වතු මහා විහාරයේ උපසම්පදා පිහිටු වූ පසු මද කලකින් ම සියම් ජාතික තෙරවරුන් අස්ගිරි මහා විහාරයේ ද උපසම්පදා කටයුතු ආරම්භ කොට ඇත. අස්ගිරි විජයසුන්දරාරාමයේ සහ ගෙඩිගේ විහාරයේ උපසම්පදා කටයුතු සිදු කොට විසිවන සියවස මැද භාගයේ දී වර්තමාන අස්ගිරි මහා විහාරයේ වර්තමාන උපසම්පදා කටයුතු සිදු වන මංගලෝපෝෂථාගාරය තනවා ඇත.

මහියංගනය, මුතියංගනය, දඹදෙණිය, මාතලේ අලු විහාරය, සුදුහුම්පොළ, ඇත්කඳ විහාරය, පොළොන්නරු සොළොස්මස්ථානය, දඹුලු රජමහා විහාරය ආදී ප්‍රධාන සිද්ධස්ථාන ඇතුළු විහාරස්ථාන අස්ගිරි පාර්ශ්වයට අයත් ය.

වාර්ෂික උපසම්පදා කටයුතුවල ප්‍රධානත්වය ගැනීම, විහාරයීය කාරක සංඝ සභාවන් හි කටයුතු මෙහෙයවීම, විහාරාධිපති තනතුරු, නායක පදවි පත් කිරීම, විහාරාරාම සහ භික්ෂූන් වහන්සේලා පිළිබඳ ආරවුල් විසඳීමේ අවසන් තීරකත්වය ගැනීම, දළදා කරඬුවේ ස්වර්ණමය යතුරු භාරකාරත්වය දරමින් දළදා මාලිගාවේ විහාරාධිපතීත්වය හෙබවීම මල්වතු අස්ගිරි මහානායක පදවිවලට පැවරුණු සුවිශේෂී වගකීම් සමුදාය අතර වෙයි.

මෙම ලිපියේ ඉතිරි කොටස
බුදුසරණ බිනර පුර අටවක පෝද
(සැප්: 13) පත්‍රයේ පළවේ.

## රාගය

සමහරු ඇඟ සනීප ඇති ලස්සන බලු පැටියකු දැක , ඌ වඩාගනිති. කවති, පොවති. බොහෝ ආදරය දක්වති. එහෙත් ඒ අය ම මයිල් වැටුණු, ඇඟ පුරා කුෂ්ටයෙන් වැසුණු, වණ තුවාල සහිත, ඇඟෙන් දුගඳ හමන, කැහැටු බලු පැටවකු දැක එළවා දමති. සමහර විට ගලින් මුලින් ගසා අහලකටවත් එන්නට නොදෙති. මෙසේ ඔවුන් එක බලු පැටවකුට ආදරයත්, තව එකකුට අනාදරයත් දක්වන්නේ මන්ද?

මෙහි රහස තව දුරට සිතා බැලුවා ම වැටහෙයි. ඔවුන් ආදර දක්වන ඒ ලස්සන බලු පැටියා ම, ලොම් වැටී, කුෂ්ට හැදී අවලස්සන වුවොත් , ඔවුන් එදා ඌට සලකන්නේ දෙවැනි කී කැහැටු බලු පැටවාට සලකන අන්දමට ම හෝ එයට ටිකක් කිට්ටු තරමින් ය.

මෙසේ එක ම සතාට අවස්ථා දෙකේ දී දෙ සැටියෙකින් සලකති. මෙයින් හැඟෙනුයේ කිමෙක් ද? ඔවුන් ආදරය දක්වන්නේ ඒ බලු පැටවාගේ ලස්සන ගතියට බවයි. එ බැවිනි ඌ ම අවලස්සන වූ විට ඔවුනට අප්‍රිය වන්නේ.

තිරිසනුන් ගැන පමණක් නො වැ, මිනිසුන් ගැනත් බොහෝ දෙනා ගේ ආදරය ඔවැනි යි. රූපය ලස්සන වැ ඇති කාලයෙහි ආදරය කරති. අවලස්සන වූ විට දකින්නට වත් කැමති නො වෙති.

ඉතින් මේ දක්වන මේ පෙරැළෙන ආදරය හොඳ ගතියෙක් ද? කුසලයෙක් ද?

මෙය හොඳ ගතියක් හැටියට, කුසලයක් හැටියට මෝඩයෝ සිතති. සත්‍යය නම් මෙය කුසලයක් නො වේ. හොඳ ගතියක් නො වේ. මෙය නම් පිටට පෙනෙන රූපයට රැවැටී එයට සිතින් වාල් වීමෙකි. සිතින් එයට ඇදී යාමෙකි. ඒ ගතිය කුසලයක් නො වේ. අකුසලයකි. සිතේ මහත් ම දුබල බවෙකි. රූපයේ ලස්සන පමණක් නො වැ කට හඬේ මිහිරිකම ආදී තවත් දෑය නිසා ද සමහරු අන් අයට ඇලුම් කරති. මෙයට ප්‍රේමය, ස්නේහය, ආදරය කියා නම් කරති. එහෙත් මෙය නම් රූප ශෝභාදිය නිසා සිතේ ඇති වන ලොල් බව යි, රාගය යි. තණ්හාව යි. ගුණදහමෙක් නො වේ. අකුසලයකි.

බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය
මහ නාහිමියන් ගේ බුද්ධ භක්තිය කෘතියෙනි



# එළාර රජු විශ්වාස කරන්නේ සොළී සේනාවේ ශක්තිය යි

දුටුගැමුණු මහ රජතුමා 45

**මිත්‍ර මහ සෙනෙවිගේ සිත තුළ සිරිනාග කෙරෙහි තිබූ කළකිරීම දවසින් දවස වැඩිවන්නට විය. ඊට ප්‍රධානතම හේතුව වුයේ තමා මහත් ඕනෑකමින් ලබා දුන් නිල නිවාසයට ඔහු මෙතෙක් පදිංචියට නොපැමිණි නිසා ය. ඒ වගේම සිරිනාග දැන් තමන්ගෙන් දුරස් වෙමින් දීඝජන්තුගේ උපදෙස් මත කටයුතු කිරීම ඉවසුම් නොදෙන්නක් විය. සිරිනාග විජිතපුර බලකොටුවට ගොස් දීඝාභය කුමරු සමඟ පැය ගණනක් කතා බහ කරමින් සිටි බව දැන ගත් පසු වඩාත් කෝපයට පත් විය.**

මිත්‍ර සෙනෙවි කල්පනා කළේ සිරිනාග හුදෙකලාව හමුවී සාකච්ඡා කිරීම කඩිනමින් කළ යුතු බව ය. ඒ අනුව ඔහු එදින හවස සිරිනාග තමන්ගේ නිවසට ගෙන්වා ගත්තේය.

මිත්‍ර සෙනෙවි හදිසියේ ම තමා කැඳවන්නේ කුමක් නිසාදැයි තීරණය කර ගත නොහැකි වුවත් සිරිනාග එහි ගියේ ය. තමන්ගේ නිල කාමරයට කැඳවූ මිත්‍ර සෙනෙවි බැරෑරුම් සකච්ඡාවකට සූදානම් විය. ඒ බව අවබෝධ කරගත් සිරිනාග පරිස්සමින් කතා කිරීමට හිතට ගත්තේය.

"දීඝාභය කුමරු අනුරාධපුර රාජධානියේ චරපුරුෂ සේවයක් පවත්වාගෙන ගිය බව මට නොකියා දීඝජන්තු මහ සෙනෙවිට පැවසුවේ මක්නිසා ද? එය ඔබ විසින් කළ ලොකු වරදක්." "ඔබතුමාට කියන්නයි හිටියේ. ආරක්ෂාව පිළිබඳ සම්මන්ත්‍රණය පැවති දවසේ රාත්‍රියේ දීඝජන්තු මහා සෙනෙවිතුමා මා නැවතී සිටි තැනට පැමිණියා. එසේ පැමිණ තිබුණේ රජතුමාගේ නියෝගයක් අනුවයි. රජතුමා කීවා ලු ඒ පිළිබඳ සම්පූර්ණ විස්තරය මගෙන් දැන ගෙන එන්න යි කියලා."

"දීඝජන්තුට තිබුණේ එම කාර්යය මට පවරන්නයි."

"මමත් ඒක පිළිගන්නවා මහ සෙනෙවිතුමනි, අපෙන් අපමණ සේවය ලබා ගත්තත්, රජතුමා විශ්වාස කරන්නේ සොළී නිලධාරීන් කෙරෙහි පමණක් බව "

"එය රාජ ද්‍රෝහී සිතිවිල්ලක්. එළාර රජතුමා එවැනි කෙනෙක් නොවෙයි. දීඝ ජන්තු මා දිහා බලන්නේ ඊර්ෂ්‍යාවෙන්, සැකෙන්. රජතුමා මට මහ සෙනෙවිකම දුන් දවසේ ඉඳලා ඔහු ඊර්ෂ්‍යා කරනවා. ඔහුට වුවමනා කරන්නේ ප්‍රධාන මහ සෙනෙවි වෙන්න. එහෙත් සිංහල සේනාව රැඳී සිටින්නේ මා නිසයි. සිංහල සේනා බලය මගෙන් ගිලිහුණොත් ඔවුන් විනාශයි. යුද්ධයේදී වැඩි බලය තිබෙන්නේ සිංහල සේනාව අතේය කියන එක එළාර රජතුමාත් තේරුම් අරගෙන තියෙන්නේ. අපිත් ඒ බව අඟවන්නට ඕනේ. ඔබට පැවරී තිබෙන වැඩ ඉවර වුණොට පසුව මාත් සමඟ වැඩ කරන්නට එන්න."

"එහෙත් දීඝජන්තු මහ සෙනෙවිතුමා නිතරම උත්සාහ කරන්නේ ඔහුගේ ආධිපත්‍ය තුළ මා රඳවා ගන්නටයි"

"සිරිනාග" මෙවර මිත්‍ර සෙනෙවි කතා කළේ තරමක් ශබ්දයෙනි. ඔහුගේ මුහුණේ රැඳුණු කෝපය ද පෙනෙන්නට විය.

"සිරිනාග, තොප කවුරු ද යන්න හොඳින් තේරුම් ගන්නට ඕනෑ. අද නුඹ විඳින වරප්‍රසාද සියල්ල ලැබුණේ කවුරු නිසා ද? අනාගතයේ නුඹට මහ සෙනෙවිකමක් ලැබෙන්නේ කවුරුන් නිසා ද?"

"ඇත්ත, මහ සෙනෙවිතුමනි, සිරිනාග කෙනකු ජීවත් වන්නේ ඔබතුමා නිසායි. ඒ සියල්ල මට මතකයි. මගේ අතීතයේත්, වර්තමානයේත්, අනාගතයේත් සාර්ථකත්වය රැඳී ඇත්තේ ඔබේ අතේ බව මම දන්නවා."

"ඒ පිළිබඳ ව මගේ හෘදයාංගම කෘතඥතාව පිරිනමනවා"

"නුඹගේ මව ආරක්ෂා කළේ මම යි. සුමන මහ සිටුතුමා ඝාතනය කළ අවස්ථාවේ එම ඝාතකයන් සොයා වෙහෙසුණේ මම. සුමලී සිටු කුමරිය එළාර මහ රජතුමාට සරණ පාවා දීමට කටයුතු කළේ මම. නමුත් ඇතැමුන් පැවසුවේ මම සුමන සිටුතුමාගේ දේපළ හිමි කර ගන්න උත්සාහ කරනවා කියලයි.

"ජයනාථ සිටුතුමාට වෙළඳ කටයුතුත්, ගොවිතැන් කටයුතුත් නැවත ආරම්භ කිරීමට උපකාර කළේ මමයි. බෝධිනාගට විමලී කුමරිය සරණ පාවා දෙන්නට සියලු කටයුතු කළේ මම. ඇය සතු ව විශාල ධන සම්භාරයක් තිබුණා. ඇය මියගිය පසුව බෝධිනාග ජීවත් වුණේ සිටුවරයෙක් වගෙයි."

"මගේ පියා මට මේ සියල්ල පවසා තිබෙනවා, මහ සෙනෙවිතුමනි"

"නුඹේ පියා කවුරු ද?"


මිත්‍ර සෙනෙවි දැඩි ස්වරයෙන් ප්‍රශ්න කළේ ය.

එය නොඇසිය යුතු ප්‍රශ්නයක් බව තේරුම් ගත් ඔහු නොසන්සුන් විය. සිරිනාග ද අවස්ථාවේ බැරෑරුම්කම තේරුම් ගත්තේ ය.

"බෝධිනාග මගේ පියා. නමුත් ඔහු මට සැලකුවේ දරුවකු හැටියට නොවෙයි. සතුරකු හැටියට. අම්මා ඉදිරිපිට දී මට පෑ ආදරය අනික් අවස්ථාවල දී තිබුණේ නැහැ. අම්මාත් ඒක තේරුම් අරගෙන හිටියා. නමුත් ඇය සිතින් දුක් වින්දා. තාත්තා කෙනකුගේ ආදරය දරුවකුට නොලැබෙන විට අත්විඳින වේදනාව මමත් වින්දා. ඔබතුමා ළඟට මා එවන්නට ඇත්තේ ඒ හින්දා. එයින් මට හොඳක් වුණා. නැති නම් මා අනාථයෙක් වීමට ඉඩ තිබුණා."

"බෝධිනාග මහා කපටියෙක්. ඌ විමලීට වස දීලා මරල දැම්මා. ඇගේ වස්තුව, සුමන මහ සිටුතුමාගේ වස්තුව සියල්ල අරගෙන පැනල ගියා. සුමන මහා සිටුතුමාගේ මරණය පිටුපස බෝධිනාග ඉන්නවා කියලා මම දන්නවා. ඔහු මෙහෙන් අරගෙන ගිය වස්තුව වියදම් කරලා මාගම ලොකු ගෙයක් අරගෙන ඉන්නවා කියලා ආරංචියි. සිරිනාගට එහෙදි ඔහු හමු නොවුණු එක පුදුමයි."

අයන්ති විතාන



පිටු සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ
කාශ්‍යප බණ්ඩාර

## වගකීමේ වැදගත්කම



**කුඩා පිරිමි ළමයෙක් තවත් ළමයින් පිරිසක් සමඟ සෙල්ලම් කරමින් සිටියා. එක්වර ම ඔහු ගේ පාපන්දුව පිට්ටනිය යාබද නිවෙසේ වැදී ජනේලයක් කැඩුණා. තමා කළ වරදට නිවැසියන්ගෙන් සමාව ඉල්ලුවා. එහෙත් ඔවුන් සමාව දුන්නේ නෑ. අලාභය වෙනුවෙන් ඩොලර් 15ක් දෙන්න මේ ළමයා එකඟ වුණා.**

**ගෙදරට ගිය ළමයා මව්පියන්ට කියා අවශ්‍ය මුදල ඔවුන්ගෙන් ඉල්ලුවා. තාත්තා සිය පුතාට මෙහෙම කිව්වා.**

**අපේ ගෙදර මුදල් තිබෙනවා. හැබැයි අද ඔයා කළ වරදට වෙන කිසි කෙනෙක් නොවෙයි, පුතා ම වග කියන්න ඕනෑ.**

**තාත්තා පුතාට නැවත කතා කොට අවශ්‍ය මුදල දුන්නා. එහෙත් එක කොන්දේසියක් මත.**

**පුතා, මේ මුදල් අලාභය වෙනුවෙන් දෙන්න. ඒත්, මා මේ මුදල් දෙන්නේ ණයට. පුතා හැකි ඉක්මනින් මේ මුදල් මට දෙන්න ඕනෑ.**

**එදායින් පසු මේ පිරිමි ළමයා පාසල් අධ්‍යාපනය කරමින් විවිධ අර්ධ රැකියා කරමින් මාස කිහිපයක් මහන්සි වුණා. හොයපු මුදල පොරොන්දු වූ පරිදි තාත්තාට දුන්නා. පුතා ආදරයෙන් වැළඳ ගත් තාත්තා මෙහෙම කිව්වා.**

**මගේ හොඳ පුතා. පුතා කළ වරද ක්‍රියාවෙන් හදා ගත්තා. තමා කළ වරදට අවංක ව වග කියන්න පුළුවන් කෙනාට කවදාවත් වරදින්නේ නෑ. මට ඔයා ගැන ආඩම්බරයි.**

**මේ දරුවා වෙන අන් කිසිවෙක් නොව එක්සත් ජනපදයේ ජනාධිපතිවරයෙක් වූ ඩොනල්ඩ් රේගන් ය.**

සියඹලාගොඩ
ධම්මින්ද හිමි








# පලාබත්ගල සඟ පරපුරෙහි මූලස්ථානයක් වූ කරන්ගොඩ පොත්ගුල් රාජ මහා විහාරය

අනුරාධපුර යුගයේ ආරම්භ ව අනුක්‍රමයෙන් මහා විහාරස්ථානයක් වශයෙන් සංවර්ධනය වී පළාබත්ගල සංඝ පරපුරෙහි මූලස්ථානයක් වශයෙන් පැවති, මහනුවර අවධියේ දී ද සුවිශේෂී වැදගත් සිදුවීම් සමුදායකට හිමිකම් කියන්නා වූ විහාරස්ථානයක් ලෙස හැඳින්විය හැකි පොත්ගුල් විහාරය රත්නපුරට නුදුරින් කරන්ගොඩ ග්‍රාමයේ පිහිටා තිබේ.





ශ්‍රීපාදස්ථානාධිපති ධර්මකීර්ති ශ්‍රී බෙංගමුවේ ධම්මදින්න නාහිමි

සතුරු උවදුරු හමුවේ පසු බැස ගිය වළගම්බා රජතුමා සපරගමුවේ සේනා සංවිධානය කිරීම ආරම්භ කළේ මෙම ගල්ලෙන් ආශ්‍රිත ව නැවතී සිටිමින් බවත්, සතුරන් පරදවා මෙහි සතිස් රියන් සැතපෙන පිළිම වහන්සේ, කුඩා වෙහෙර වහන්සේ සහිත ව විහාරස්ථානය තනවා තමාට උපකාර කළ කුප්පිකල තිස්ස තෙරුන්ට පූජා කළ බවත් ජනප්‍රවාදයේ සඳහන් වෙයි.

මාතලේ අලුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කළ ත්‍රිපිටකය සපරගමුවේ හා රෝහණයේ විහාරස්ථාන සඳහා බෙදා හැරීමට පිටපත් කරන ලද්දේ සහ ගබඩා කරන ලද්දේ පොත්ගුල් විහාරයේ සිට ය යනු තවත් මතයකි. පුස්කොළ පොත් පිටපත් කිරීමේ සංසිද්ධි සමඟ බැඳි තිබීම නිසා විහාරස්ථානයේ නම පටබැඳි ඇතැයි සැලකිය හැකි ය.

විහාර බිමෙහි කටාරම් කෙටූ ගල්ලෙන් පැරැණි සංඝාරාම වශයෙන් භාවිත කරන ලදැයි සැලකීමට පුළුවන. ලෙන් විහාරයේ ම ස්වභාවික කුඩා ජල උල්පතක් පිහිටා තිබේ. ගල් ගුහා අතර වළගම්බා රජු දවස තනවන ලද උමඟක් හමු වෙයි. ගල් ලෙන්වලට ආසන්නයේ දාගැබ තනවා බෝධීන් වහන්සේ රෝපණය කරවා ඇත. අලුත් විහාරයේ දෙරටුවට ඉහළින් වූ කුහරයේ තිබී තඹ පොතක් හමු වූ බව කියැවේ.

පොළොන්නරු යුගයෙන් පසු පලාබත්ගල ධර්මකීර්ති සංඝරාජ මාහිමියන්ගේ පරපුරට අයත් විහාරස්ථානයක් වශයෙන් පොත්ගුල් විහාරය සම්භාවනාවට පත් විය. පොත්ගුල් විහාරය, පැල්මඩුල්ල සහ පලාබත්ගල විහාර ත්‍රිත්වය පලාබත්ගල සඟ පරපුරෙහි මූලස්ථාන වශයෙන් සැලකෙයි.

පලාබත්ගල දී ලියන ලද පොත් පිටපත් කරන ලද්දේ ද පොත්ගුල් විහාරයේ දී යැයි කියැවේ. පුස්කොළ පොත් ලිවීමට යොදා ගත් තල් පත්තිරු එකිනෙක ඇමිණීම පිණිස තල් පත සිදුරු කළ යුතු ය. සිදුරු කිරීමේ දී ඉවත් කෙරෙන කවාකාර කුඩා තල් පත් කොටස කරන් ලෙස හඳුන්වයි. පුස්කොළ සඳහා ද කරන් ලෙස ව්‍යවහාර වෙයි. විශාල පොත් ප්‍රමාණයක් පිටපත් වූ බැවින් විශාල කරන් ප්‍රමාණයක් ද ගමෙහි එකතු විය. කරන්ගොඩ යන ග්‍රාම නාමය ද මේ නිසා ව්‍යවහාර වූ බව පිළිගැනීමයි.

සීතාවක රාජසිංහ රජුගේ අභාවයෙන් පසු සපරගමුවේ බලය තහවුරු කරගත් පෘතුගීසීන් විසින් පොත්ගුල් විහාරය විනාශ කරවා මෙහි බලකොටුවක් නිර්මාණය කරවීය. සීතාවක රාජසිංහ රජු විසින් ආඬින්ට පවරා දුන් ශ්‍රීපාදස්ථානයෙන් ආඬින් පළවා හරින ලද්දේ පොත්ගුල් විහාරයේ වැඩසිටි මහ මඩගම්මන සිල්වත් තැන විසිනි.

පලාබත්ගල ධර්ම ශාස්ත්‍රීය පරපුරට අයත් පැල්මඩුල්ල පුරාණ දාගැබ් රාජමහා විහාරයට නවෝදය සැපයූ කපුගන්කන්දේ සිල්වතුන්ගේ ඥාතිවරයකු වූ වේහැල්ලේ ධම්මදින්න හිමියන් ස්‍යාමෝපසම්පදාව පිහිටුවීමට පෙර සිට පොත්ගුල් විහාරයේ වැඩ හිඳිමින් ධර්ම ශාස්ත්‍රීය මෙහෙවරෙහි නිරත වූ හ. වේහැල්ලේ හිමියන් මහනුවරට ගොස් වැලිවිට සරණංකර මාහිමියන් ගේ සිල්වත් සමාගමට එක් ව විචිත්‍ර ධර්මකථික හිමිනමක වශයෙන් සහ පුස්කොළ පොත් පිටපත් කිරීමෙහි සමර්ථයකු ලෙසින් ප්‍රකට වූයෙන් සංඝ රාජ හිමියන් විසින් මල්වතු විහාරයේ සිට අද මහනුවර වැව පිහිටි තැන එදා පිහිටි ටිගොල්වෙල කෙත් යාය මැදින් රජ මැදුරට කැඳවා ගෙන ගොස් රජුට හඳුන්වා දුනි.

වේහැල්ලේ හිමියන් මිරිවැඩි සඟලක් පැළඳ රජ මැදුරට පැමිණීම පිළිබඳ රජු ගේ අසතුට පළ වූ අවස්ථාවෙහි රුහුණේ වේහැල්ලේ සිට දුර බැහැර ගෙවා පැමිණීමේ දී පාදයේ ආබාධ හටගෙන ඇති නිසා ශිෂ්‍යයා මිරිවැඩි සඟල පැළඳ සිටින බව සඟරජ හිමියන් දැන්වී ය. වේහැල්ලේ හිමියන්ගේ දේහ ලක්ෂණ හා උගත්කම් කෙරෙහි පැහැදුණු රජතුමා රජ මැදුරේ ධර්ම දේශනා සඳහා ඇරයුම් කළේ ය. පහතරට ජන ප්‍රධානීන් සමඟ වේහැල්ලේ නාහිමියන් පැවැත්වූ සම්බන්ධකම් කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා පෘතුගීසීන් සමඟ සටන් කිරීමේ දී එම ප්‍රධානීන් ගේ පක්ෂපාතීත්වය රජු වෙත පවත්වා ගැනීමට උපයෝගී කරගත් තොරතුරු හමු වෙයි. උපසම්පදාවෙන් පසු යළි ගම් ප්‍රදේශයට වැඩමවීමේ දී කුට්ටාපිටිය සන්නස සහිත ව ශ්‍රීපාදස්ථානය, පැල්මඩුල්ල ඇතුළු විහාරස්ථාන ද පහතරට නායක පදවිය ද පිරිනමන ලදි. වේහැල්ලේ ධම්මදින්න නාහිමියන් වැඩි කලක් වැඩසිටි ස්ථානය ද පොත්ගුල් විහාරයයි.

වේහැල්ලේ ධම්මදින්න නාහිමියන් පොත්ගුල් විහාරයේ දී අපවත් වූ පසු පසු තත් ශිෂ්‍යවර කඹුරුපිටියේ සඟිධර ගුණරතන නාහිමියන් ශ්‍රීපාදස්ථානය, පැල්මඩුල්ල සහිත ව පහතරට නායක පදවියටත්, පොත්ගුල් විහාරයේ ආධිපත්‍යයටත් පත් වූ හ. සූත්‍ර පිටකයේ නිකාය දෙකක් ද, අභිධර්ම පිටකයේ ධම්මසංගණීප්පකරණය හා අභිධර්මාර්ථ සංග්‍රහයත්, විනය පිටකයේ පාරාජිකා පාලිය හා ප්‍රාතිමෝක්ෂය වාචෝද්ගත කළ බැවින් සඟිධර යන උපාධිය ලද ගුණරතන නාහිමියෝ දහ අට රියන් සැතපෙන පිළිම වහන්සේ සහිත පැරැණි ලෙන් විහාරය ඇතුළු පොත්ගුල් විහාරයේ නිම නොවූ විහාර කර්මාන්ත නිම වූ හ.

කඹුරුපිටියේ සඟිධර ගුණරතන නාහිමියන් මහනුවර වැඩසිටි බැවින් තත් ශිෂ්‍ය කුඩා කඹුරුපිටියේ හිමියන් පැල්මඩුල්ලේ ද, මාලිම්බඩ ධම්මාධර හිමියන් පොත්ගුල් විහාරයේ ද, වැඩ සිටි අතර ගුණරතන නාහිමියන්ගෙන් පසු මාලිම්බඩ ධම්මාධර හිමියන් පොත්ගුල් විහාරයේ ආධිපත්‍යයට පත් වූ හ. අංගම්මන විහාරාධිපති ව වැඩ සිටි පනාවැන්නේ හිමියන් විසින් තත් විහාරය සහ ඊට අයත් සියලු වස්තූන් ද වීරහින්නේ අප්පු විසින් තම වස්තු සම්භාරය ද මාලිම්බඩ ධම්මාධාර හිමියන් වෙත පිරිනැමූ සන්නස් හමු වෙයි. මාලිම්බඩ ධම්මාධාර හිමියන්ගේ ශිෂ්‍ය පොත්ගුල් වෙහෙරපති මිල්ලවිටියේ සීලවංශ හිමියන් වෙත ශ්‍රී වික්‍රම රාජසිංහ දවස පිළිමතලාවේ මහාධිකාරම් තුමා විසින් අක්කර පන්දහස ඉක්ම වූ ගලතුරේගම සහිත ව සුවිශාල භූමි ප්‍රදේශයක් පූජා කරන ලදි. කරන්ගොඩ සංඝරක්ඛිත මා හිමි, කරන්ගොඩ රතනජෝති මා හිමි, කරන්ගොඩ රතනපාල මා හිමි සහ කරන්ගොඩ ජිනරතන නාහිමිවරුන් විහාරාධිපති පදවිය හොබවා ඇත.

ශ්‍රීපාදස්ථානාධිපති ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ කුලපති, ධර්මකීර්ති ශ්‍රී සුමංගල රතනපාල ධම්මරක්ඛිත බෙන්ගමුවේ ධම්මදින්න නාහිමියන් ගේ මෙහෙයවීමෙන් පොත්ගුල් විහාරයේ ශ්‍රී රතනපාල ධර්මායතන මූලික පිරුවන ආරම්භ කිරීම සුවිශේෂී සිද්ධියකි.

ලක්දිව සිසාරා පැතිරුණු ශාස්ත්‍රීය ප්‍රබෝධයන්හි දී යුගයෙන් යුගයට සුවිශේෂී දායකත්වයක් ලබා දුන් පුද බිමක් ලෙස කරන්ගොඩ පොත්ගුල් විහාරය සම්භාවනාවට පත් වෙයි.

> පොළොන්නරු යුගයෙන් පසු පලාබත්ගල ධර්මකීර්ති සංඝරාජ මාහිමියන්ගේ පරපුරට අයත් විහාරස්ථානයක් වශයෙන් පොත්ගුල් විහාරය සම්භාවනාවට පත් විය. පොත්ගුල් විහාරය, පැල්මඩුල්ල සහ පලාබත්ගල විහාර ත්‍රිත්වය පලාබත්ගල සඟ පරපුරෙහි මූලස්ථාන වශයෙන් සැලකෙයි.

දිමුතු පුන්සර කොළඹගේ